**2017 වර්ෂය සඳහා**

# කාර්යසාධන වාර්තාව
# සහ
# වාර්ෂික ගිණුම්

## වාණිජ දෙපාර්තමේන්තුව

**[295 වන ශීර්ෂය]**

*4 වන මහල, රක්ෂණ මන්දිරය,*
*අංක: 21, වොක්ෂෝල් වීදිය,*
*කොළඹ 02*
*දුරකථන:* ***011- 232 9733 / 243 6114***
*ෆැක්ස්:* ***011 -243 0233***
*විද්‍යුත් තැපෑල:* ***fortrade@doc.gov.lk***
*වෙබ් අඩවිය:* ***www.doc.gov.lk***

**පටුන**


| | | පිටුව |
|---|---|---|
| 1 | හැඳින්වීම | 01 |
| 2 | 2017 වර්ෂයේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය | 04 |
| 3 | බහුපාර්ශවික වෙළඳ සබඳතා | 09 |
| 4 | ද්වීපාර්ශවික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව | 18 |
| 5 | කලාපීය ආර්ථික සහයෝගීතාවය | 21 |
| 6 | වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය | 24 |
| 7 | ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම | 32 |
| 8 | කාර්ය මණ්ඩල සංචලන | 33 |
| 9 | මූල්‍ය ප්‍රකාශය | 35 |

## වගු ලැයිස්තුව


| | පිටුව |
|---|---|
| *ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය (2010-2017)* | 05 |
| *වාණිජ නිළධාරීන් විසින් සිදුකර ඇති ක්‍රියාකාරකම්වල සාරාංශය* (2017) | *25* |
| *නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් 2015-2017* (*ගිවිසුම් අනුව*) | *32* |
| *මූල්‍ය ප්‍රකාශය* | *35* |


## ප්‍රස්ථාර සටහන් ලැයිස්තුව


| | පිටුව |
|---|---|
| *වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන* | *02* |
| *වාණිජ දෙපාර්තමේන්තුවේ සබඳතා* | *03* |
| *ශ්‍රී ලංකාවේ අපනයන සහ ආනයන සංයුතිය* | *06* |
| *ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ගමන් මඟ* | *07* |
| *කාර්ය මණ්ඩල සංවලන* | *33* |

## 1. හැඳින්වීම

**<u>දැක්ම</u>**

*"ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම"*

**<u>මෙහෙවර</u>**

***"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."***

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් පහත සාරාංශයෙන් දැක්වේ.


- අදාළ රේඛීය අමාත්‍යාංශ / අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.

- විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාණිජමය අපේක්ෂාවන් ප්‍රවර්ධනය කිරීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම්ව එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙලෙස, 2017 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම, නව වෙළඳපළ සොයා ගැනීම, නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, අන්තර්ජාතික වෙළඳපලවල් වලට පිවිසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) අංශ දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ මූලස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින්, ඍජු විදේශ ආයෝජන සහ ආයෝජන කළඹ ප්‍රවර්ධනය මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයද ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ සහාය ද ලබාදෙන ලදී.

# වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන





## කෙටි යෙදුම්

| | |
|---|---|
| D | අධ්‍යක්ෂ |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| AD | සහකාර අධ්‍යක්ෂ |
| CRO | වාණිජ පර්යේෂණ නිළධාරී |
| DO | සංවර්ධන නිළධාරී |
| Mgt. Asst. | කළමනාකරණ සහකාර |
| KKS | කා. කා. ස. |

* වඩාත් ජ්‍යෙෂ්ඨතම (අධ්‍යක්ෂ මට්ටමේ) නිලධාරීන් ලෝක වෙළඳ සංවිධානයේ ස්ථිර නියෝජිත/ තානාපති, වොෂින්ටන්, ලන්ඩන්, බ්‍රසල්ස් සහ කරච්චි යන ස්ථානයන්හි දූත මණ්ඩල සඳහා පත්කළ යුතුය.

## අපගේ සබඳතා



සම්බන්ධී කරණ කටයුතු
කේන්ද්‍රීය ආයතනය ලෙස
රේඛීය අමාත්‍යාංශ හා වෙනත් රාජ්‍ය ආයතන
ලෝක වෙළඳ සංවිධානය සහ අනෙකුත් වෙළඳ කටයුතු සම්බන්ධ සංවිධාන
කලාපීය හා ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම්
වරණීය වෙළඳ ගිවිසුම්
වෙළඳ සහ ආර්ථික සහයෝගිතා සඳහා වන ඒකාබද්ධ කමිටු
පෞද්ගලික අංශය
වෙළඳ ප්‍රවර්ධන සංවිධාන
වෙළඳ මණ්ඩල

## 2. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය

2017 වසරේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමේ දැක්ම වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා සහ වසර පුරාම පවතින අභ්‍යන්තර හා බාහිර අභියෝගයන්හි බලපෑම කෙරෙහි යොමු වී ඇත. ලෝක වෙළඳාමේ බාහිර මුහුණතෙහි නොවෙනස් වර්ධනය, දියුණු ආර්ථිකයන්හි මන්දගාමී ආර්ථික වර්ධනය, වෙළඳ පාර්ශවකරුවන් අතර සිදුවන වෙළඳ හා මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්කම්, භූ දේශපාලනික ස්ථාවරත්වය, සහ වෙළඳ පාර්ශවකරුවන්ගේ ආරක්ෂණවාදී පියවරයන් ආදිය ශ්‍රී ලංකාවේ වෙළඳාම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. 2016 මහ බැංකුව වාර්තාවේ දැක්වෙන පරිදි සහ 2025 දැක්ම ප්‍රකාශයෙහි දැක්වෙන පරිදි වෙළඳ හිඟයේ ඉහළ යාම, ගෝලීය අපනයන සහ ද.දේ.නි යේ කොටසක් ලෙස අපනයනය ප්‍රමාණය අඩු වීම සහ නොවෙනස්ව පවතින විදේශීය සෘජු ආයෝජනය යනාදිය විසඳුම් ලබාදිය යුතු ප්‍රධාන කරුණු කිහිපයක් වේ. තවද, නිෂ්පාදනය හා ඵලදායීතාවය වර්ධනය කිරීම, අපනයන භාණ්ඩයන්ගේ තරඟකාරීත්වය ඉහළ දැමීම, අගය එකතු කළ නිෂ්පාදන වෙත යොමු වීම,පටු අපනයන සංයුතිය පුළුල් කිරීම, අපනයන ගමනාන්ත විවිධාංගීකරණය කිරීම, සේවා අපනයනයන් හඳුනා ගැනීම සහ ගෝලීය වෙළඳපොළ වෙත පිවිසීම සඳහා සුළු හා මධ්‍යම පරිමානයේ ව්‍යාපාර දියුණු කිරීම  ආදිය හඳුනාගත් අභියෝග වන අතර ඒවා රටෙහි තිරසාර ආර්ථික සංවර්ධනය සුරක්ෂිත කිරීම සඳහා යොදාගත හැකි උපක්‍රම ලෙස ද සැලකේ.

ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳාමේ අනාගත දිශාව පිළිබඳව 2017 පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ දැක්ම 2025 හි සඳහන් වේ. ඉන්දීය සාගරයේ වාණිජ කේන්ද්‍රය බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා ආර්ථික උපක්‍රම පිළිබඳ එහි අවධාරණය වේ. ඉදිරි පස් වසර ඇතුලත ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායමක් ලබන රටක් බවට පත් කිරීම සඳහා රටෙහි ඒක පුද්ගල ආදායම ඇ.ඩො.5,000 දක්වා ඉහළ දැමීම, නව රැකියා මිලියනයක් උත්පාදනය, වර්ෂයකට ඇ.ඩො. බි. 5 දක්වා සෘජු විදේශ ආයෝජනය ඉහළ දැමීම හා වත්මන් අපනයනයන් දෙගුණ කරමින් වර්ෂයකට ඇ.ඩො.බි. 20 ක් දක්වා ඉහළ දැමීම එහි අරමුණ වේ.
ශ්‍රී ලංකාව අපනයනාභිමුඛ ආර්ථික කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා විදේශීය වෙළඳාම කදිම උත්ප්‍රේරකයකි. අපනයන සඳහා වත්මන් වෙළඳපොළ දියුණු කිරීම සහ නව වෙළඳපොළ හඳුනා ගැනීම, දැනුම මත පදනම් වූ කර්මාන්තයන් වෙත විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ගෝලීය අගයදාමය වෙත එකතු වීම යන ප්‍රධාන අංශ තුලින් ඉහත ඉල්ලක්ක කරා ලඟා විය හැකි වේ. එහෙත් දේශීය සැපයුම සහ සහ ශක්‍යතා බාධකයන්, අපනයන තරඟකාරීත්වය, ප්‍රමිති හා සම්බන්ධ ගැටළු, භාණ්ඩ හා සේවා සඳහා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්, ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා බලපාන්නා වූ තීරුබදු නොවන සාධක, ව්‍යාපාර කිරීමේ පහසුව (Ease of Doing Business-WB) සහ ගෝලීය තරඟකාරීතවය (WEF) වැනි ජාත්‍යන්තර ආයෝජන දර්ශක/ප්‍රමිති ආදියෙහි ඉහළ ස්ථානයකට ලඟා වීම වැනි ඒ හා අනුබද්ධිත අත්‍යාවශ්‍ය කරුණුවලට විසඳුම් ලබා දීම එසේම පවතී.
සමාලෝචන වර්ෂය තුල, වෙළඳ පාර්ශවකරුවන් සමඟින් ආර්ථික සම්බන්ධතා ගොඩ නගා ගැනීම සහ ස්ථාවර කර ගැනීම, සරල තීරුබදු ක්‍රමයකින් සහ බදු සංශෝධනයන් තුලින් ආයෝජක විශ්වාසය ඇති කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කිරීම සහ ව්‍යාපාර කටයුතු සඳහා පහසුකම් සලසා දීම සඳහ රජය ප්‍රයත්න දරා ඇත.
ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය මඟින් පවත්නා ජාත්‍යන්තර වෙළඳපොළ  තුල වෙළඳපොළ කොටස වර්ධනය කර වෙළඳාම ප්‍රවර්ධනය සහ ආයෝජන ආකර්ෂණය සඳහා ද්වීපාර්ශවීය, කලාපීය සහ බහුපාර්ශවීය වෙළඳ ගිවිසුම් තුලින් නව වෙළඳපොළ වෙත පිවිසීමේ වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරයි. සමාලෝචනයට යටත්වන කාලය තුල, යුරෝපා කොමිසම (EC) විසින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය වෙත පනවන ලද තහනම සාර්ථකව ඉවත් කරගැනීමෙන් සහ 2010 දී සිදුකල තහනමෙන් පසු 2017 මැයි සිට යුරෝපා සංගමයේ GSP Plus ක්‍රමය නැවත ලබා ගැනීමෙන් නිෂ්පාදන 7200 ක ප්‍රමාණයක් සඳහා තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා ගැනීම මෙන්ම ඇ.එ.ජ. වෙළඳපොළ වෙත ප්‍රවාහන භාණ්ඩ සඳහා තීරුබදු රහිත ප්‍රවේශයක් ලබා ගැනීම හරහා යුරෝපා සංගමය සහ ඇ.එ.ජ වැනි ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් සමඟ පවතින ඒකපාර්ශවීය ජී.එස්.පී  ක්‍රම මඟින් වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා ගණනාවක් ඇතිකර ගැනීමට මාර්ගය විවර විය. වෙළඳාම ප්‍රවර්ධනයේ දී සහ වෙළඳාම සම්බන්ධ ගැටළු විසඳීමේ දී වෙළඳ පාර්ශවකරුවන් සමඟ අන්‍යෝන්‍ය සහයෝගීතාවය වර්ධනය කිරීමට එකාබද්ධ ආර්ථික කමිටු යටතේ පවත්වන ලද ද්වීපාර්ශවීය සාකච්ඡා සහ පසුවිපරම් කටයුතු මඟින් හැකි වී ඇත.


ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙක් වී සිටින නිදහස් වෙළඳ ගිවිසුම් සහ වරණීය වෙළඳ ගිවිසුම්, වරණයන්ගේ උපරිම භාවිතය සහ වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා තවදුරටත් යොදා ගනියි. ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුමේ 4 වන වටය 2017 නිමා කිරීම මඟින් චීනය සහ දකුණු කොරියාව වෙත වර්ධිත වෙළඳපොළ ප්‍රවේශයක් ලබා දෙනු ඇත. එමෙන්ම, ඉන්දියාව හා පකිස්ථානය සමඟ ඇතිකරගත් නිදහස් වෙළඳ ගිවිසුම්වලට අමතරව, සමාලෝචනයට බඳුන් වූ කාලය තුල දී සිංගප්පූරුව සමඟ සාකච්ඡා අවසන් කරන ලද ගිවිසුමෙන් ගෝලීය අගය දාම කටයුතු සහ නිෂ්පාදන බෙදාහැරීමේ ජාල හරහා තවත් ආයෝජන සහ ව්‍යාපාරික අවස්ථා ලබා ගැනීම අපේක්ෂා කෙරේ.  නෛතික පදනම සහිත බහුපාර්ශවීය වෙළඳ පද්ධති සඳහා සහය පල කරන, ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයකු ලෙස ශ්‍රී ලංකාව වෙළඳාම පහසුකරන ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව දායක විය. එය 2016 මැයි මස ස්ථිර කරන ලදී. සුමට වෙළඳ ප්‍රවාහයක් සඳහා දේශ සීමා බාධක ඉවත් කිරීම සඳහා වෙළඳාම පහසුකරණ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් දැනුම්දීම සහ ක්‍රියාත්මක කිරීම 2017 වසරේ දී සිදු විය. වර්ෂය තුලදී, වෙළඳ පිරිවැය අවම කිරීම සහ අපනයන තරඟකාරීත්වය ඉහළ දැමීම අපේක්ෂා කරමින් "තනි කවුළු" වැඩසටහන් ව්‍යාපෘතිය සහ "වෙළඳ ද්වාරය" නිර්මාණය කිරීම, කඩිනම් කෙරිණි. වෙළඳපොළ තුල ඇතිවන  අසාධාරණ තරඟකාරීත්වයෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීමේ අරමුණින් දිගු කලක් පුරාවට නොවිසඳී පැවති ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සහ ආරක්ෂණ පියවර පනත සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ද සමාලෝචන වර්ෂය තුල සිදු විය.

**ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය 2010-2017**
**(වටිනාකම ඇ.ඩො.මි )**


| වර්ෂය | අපනයන | වර්ධනය % | ආනයන | වර්ධනය % | සමස්ත වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| **2010** | 8,294 | 16.5 | 12,340 | 26.4 | 20,634 | -4,047 |
| **2011** | 10,018 | 20.8 | 19,703 | 59.7 | 29,721 | -9,685 |
| **2012** | 9,181 | -8.4 | 17,889 | -9.2 | 27,069 | -8,708 |
| **2013** | 10,009 | 9.0 | 17,098 | -4.4 | 27,107 | -7,088 |
| **2014** | 11,044 | 10.3 | 19,246 | 12.6 | 30,290 | -8,202 |
| **2015** | 10,212 | -7.5 | 18,989 | -1.3 | 29,201 | -8,777 |
| **2016** | 10,217 | 0.1 | 19,515 | 2.77 | 29,732 | -9,298 |
| **2017** | 11,411 | 11.69 | 21,324 | 9.27 | 32,735 | -9,913 |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව*

### 2.1 අපනයන හා ආනයන කාර්ය සාධනය






2017 වසර තුල ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායම ඇ.ඩො.මිලියන 11,411 ලෙස පැවති අතර 2016 වසරේ දී එම අගය ඇ.ඩො.මිලියන 10,217 ක් විය.
ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායමෙන් 42% කට දායකත්වය ලබාදෙමින් ඇඟළුම් ක්ෂේත්‍රය ඉදිරියෙන්ම සිටින අතර එය 2016 වසර හා සැසඳීමේ 3%ක සුළු අඩු වීමක් පෙන්නුම් කරයි. 2017 වසරේ දී අපනයන ආදායමට ඇති දායකත්වයෙන් තේ, කෝපි සහ කුළු බඩු (16%) දෙවන තැන ගනු ලබන අතර, රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන (8%), ඛණිජ නිෂ්පාදන (3%) සහ නැව්, බෝට්ටු සහ පාවෙන ආකෘතීන් (2%)න් පිළිවෙළින් දායකත්වය දක්වා ඇත .





2017 වසර තුල ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම 2016 වසරේ අගය වූ ඇ.ඩො.මිලියන 19,515 සිට ඇ.ඩො. මිලියන21,324 දක්වා 9.27% ක වර්ධනයක් සලකුණු කරමින් වැඩි වී ඇත. ශ්‍රී ලංකාවේ ආනයන පැසෙන් 15% ක කොටසක් අත් කර ගනිමින් ඛණිජ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිතයන් ප්‍රමුඛ ස්ථානයේ සිටියි. යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ (8%), වාහන සහ අමතර කොටස් (7%), විද්‍යුත් යන්ත්‍ර සහ උපකරණ (6%), සහ රෙදිපිළි (4%) අනෙකුත් ප්‍රධාන ආනයන අයිතමයන් අතර වේ.

## 2.2 අපනයන හා ආනයන දිශාව






**2017**

| **අපනයන (%)** | |
|---|---|
| යුරෝපා සං. (EU) | 29.11 |
| ඇ.එ.ජ. (USA) | 25.52 |
| ඉන්දියාව | 6.00 |
| චීනය | 3.64 |
| එ. අරාබි එමීර් | 2.40 |

**2017**

| **ආනයන (%)** | |
|---|---|
| ඉන්දියාව | 21.08 |
| චීනය | 19.65 |
| යුරෝපා සං. (EU) | 08.34 |
| ජපානය | 04.87 |
| ඇ.එ.ජ. (USA) | 03.80 |

## 3. බහු-පාර්ශ්වික වෙළඳ සම්බන්ධතා

ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා මගින් ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින්, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ඇතුළත් වෙනත් බහු පාර්ශ්වීය සංවිධාන කිහිපයක් සමඟ සමීප සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ.

### 3.1 ලෝක වෙළඳ සංවිධානය (WTO) තුළ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම

11 වැනි අමාත්‍ය කමිටුව පවත්වනු ලබන 2017 වසර පැවති සාකච්ඡාවන්ගේ සැලකිය යුතු වෙනසක් සිදු නොවීම ආරම්භ වූ අතර සංයුක්ත යෝජනාවල තීරණ දෙසැම්බර් මස බුනොස් එයාර්ස් (buenos aires) හි පැවැත්වන අමාත්‍ය කමිටුවේ දී ගැනීමට නියමිත විය. ලෝක වෙළඳ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් රොබැර්ටෝ අසවේදු මහතා විසින් වසර මුලදී පැවත් වූ රැස්වීමක දී සිව් වසරක කාලයක් සඳහා තමාගේ නැවත පත්වීම නිවේදනය කරමින් බහුපාර්ශවීය වෙළඳ ක්‍රමය පිළිබඳ සමාජිකයින්ගේ ඇගයීම ලෝක වෙළඳ සංවිධානය වෙනුවෙන් ප්‍රකාශ කරන ලෙස සාමාජිකයින් උනන්දු කරන ලදී.

ගිම්හාන නිවාඩුව අවසන් වීමත් සමඟම, සාමාජිකයින් විසින් කෘෂිකාර්මික රාජ්‍ය තොග තැබීම, කෘෂිකර්මාන්ත දේශීය සහය, කෘෂිකාර්මික නිෂ්පාදන හා සේවා සඳහා අපනයන තහනම් කිරීම් සහ සීමා කිරීම් හා දේශීය රෙගුලාසි වැනි දිගුකලක් පුරා පැවති ගැටලු මෙන්ම විද්‍යුත් වාණිජ්‍ය, ආයෝජන පහසුකරණය, MSME, කෘෂි නොවන වෙළඳපොළ ප්‍රවේශය (NAMA) සහ අභියාචනාධිකරණ ආයතන පත්කිරීම ආදී නව ගැටලු ගණනාවක් පිළිබඳ ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීම ආරම්භ කරන ලදී. සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජන 7 ක් පදනම් කරගනිමින් ධීවර සහනාධාර විධිමත්ව ලබාදීම පිළිබඳ සාකච්ඡා වසර පුරාම පැවැත්විය.

වර්ෂය තුලදී,ජිනිවා හි පිහිටි ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලය විසින් බහුපාර්ශවීය සීමාවේ සිටින ශ්‍රී ලංකාවට වැදගත් හා හිතවත් ද්වීපාර්ශවීය සම්බන්ධතා පවතින වෙළඳ පාර්ශවයන් ශක්තිමත් කරගැනීම සඳහා නිරන්තර ප්‍රයත්නයන් දරමින්, යුරෝපා සංගමය, ජපානය, ස්විස්ටර්ලන්තය, මෙක්සිකෝව, උරුගුවේ, ජැමෙයිකාව, කාම්බෝජියාව, සියෙරා ලියොන් සහ නයිජීරියාව යන රටවල වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයෙහි දී ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලදී.

ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිත විසින් ද වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ කමිටුවේ වෙළඳාම සඳහා සහාය යන සැසිවාරය අමතමින් එම අංශයේ විශේෂ ඉල්ලීමක් මත ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලද අතර එහිදී ශ්‍රී ලංකාව දැනටමත් ප්‍රතිලාභ ලබා ඇති දායක සහාය වැඩසටහන් සහ ඉදිරියේදී එවැනි දායක සහායක වැඩසටහන් යොදාගත හැකි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලදී. එම රැස්වීමට දායක වූ රටවල් සහ දායක ආයතන කිහිපයක් ද සහභාගී විය.

### 3.2. ලෝක වෙළඳ සංවිධානයේ 11 වන අමාත්‍ය සම්මේලනය

ලෝක වෙළඳ සංවිධානයේ 11 වන අමාත්‍ය සම්මේලනය 2017 දෙසැම්බර් මස 10-13 දිනයන් හි ආර්ජන්ටිනාවේ බුනොස් එයාර්ස් හි පවත්වන ලදී. එම සම්මේලනයේ දී අමාත්‍යවරුන් විසින් පහත ක්ෂේත්‍ර සඳහා නියමිත තීරණ ලබා ගැනීමට සිදු විය.

(i) කෘෂිකර්මාන්තය - රාජ්‍ය තොග තැබීම, සංවර්ධනය වෙමින් පවතින රටවලට විශේෂිත සුරක්ෂණ යාන්ත්‍රණය, කෘෂිකර්මය යටතේ ලෝක වෙළඳාම තවදුරටත් ලිහිල්කිරීමට බලපාන දේශීය සහාය අවම කිරීම.

(ii) ධීවර සහනාධාර නීතිවිරෝධී, නියාමනය නොවන සහ වාර්තා නොවන මාළු ඇල්ලීම සඳහා වන සහනාධාර තහනම් කිරීම සඳහා බහුපාර්ශවීය නීති සම්මත කර ගැනීමට තීරණ ගැනීම මෙහිදී අමාත්‍යවරුන්ගෙන් අපේක්ෂා කරන ලදී.

(iii) සංවර්ධනය - සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත රටවල් සඳහා බහුපාර්ශවීය වෙළඳ නීති පැනවීමේ දී විශේෂ හා වෙනස්කොට සැලකීමේ ක්‍රමයක අවශ්‍යතාව පිළිබඳ මූලික කරගනිමින් සාකච්ඡාවන් පැවැත්විණි.

(iv) විද්‍යුත් වාණිජ්‍ය - ඇතිවිය හැකි බහුපාර්ශවීය නීති සඳහා ලෝක වෙළඳ සංවිධානයේ දැනට පවතින විද්‍යුත් වාණිජ වැඩසටහන ශක්තිමත් කිරීම හෝ නොකිරීම සඳහා තීරණ ගැනීම පිණිස සාකච්ඡා පැවැත්වීම.

(v) සේවා -සේවා සඳහා වන දේශීය නීති රෙගුලාසි සඳහා නව නීති.

(vi) ආයෝජන පහසුකිරීම සහ සූක්ෂම, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර (MSMEs) පිළිබඳ සාකච්ඡා වැනි යෝජිත නව ගැටලු සඳහා අමාත්‍ය තීරණ ගැනීම පිණිස සාකච්ඡා පැවැත්වීම.

කෙසේවෙතත්, සම්මේලනයෙන් පොදු අමාත්‍ය ප්‍රකාශයකට හෝ ප්‍රධාන කරුණු කිසිවක තීරණයන් ගැනීමෙහි ලා එකඟතාවයකට එළැඹීමට නොහැකි විය. එම රැස්වීම MC11 ක්‍රියාපටිපාටිය පිළිබඳ සභාපතිගේ සාරාංශයෙන් පසු අවසන් විය. ඒවා නම්

1. 2019 වසරේ පැවැත්වෙන මීලඟ අමාත්‍ය සම්මේලනය වන විට ධීවර සහනාධාර විධිමත් කිරීමේ සාකච්ඡා පැවත්වීම.
2. විද්‍යුත් වාණිජ්‍ය පිළිබඳ වැඩසටහනේ කටයුතු සිදු කරගෙන යෑම සහ විද්‍යුත් සම්ප්‍රේෂණයන් සඳහා තීරු බදු අය කිරීමට එකඟ වූ රටවල් සඳහා විද්‍යුත් වාණිජ පමා සහනය නැවත අලුත් කිරීම.
3. සාමාජික රටවල් විසින් එකඟ වූ ලෝක වෙළඳ සංවිධානයේ බුද්ධිමය දේපල හිමිකම් වෙළඳාම සම්බන්ධ කරුණු පිළිබඳ ගිවිසුම)TRIPS යටතේ ප්‍රචණ්ඩකාරී නොවන ගැටලු ඉදිරිපත් නොකිරීම සඳහා ප්‍රචණ්ඩකාරී නොවන සහ තත්ත්ව චෝදනා පිලිබඳ පමා සහනය නැවත අලුත් කිරිම

තෙදිනක් පුරා සම්මේලනයේදී සාකච්ඡා වූ වෙනත් ගැටලු සම්බන්ධව නව වැඩසටහන් නොමැති වීමෙන්, අමාත්‍යවරුන් විසින් පූර්ව විධිනියෝගයන්ට හා ලෝක වෙළඳ සංවිධානයේ ඉදිරි වැඩකටයුතු සිදු කිරීම සඳහා යොද ගැනීම පිණිස බුනොස් එයර් හි දී ඉදිරිපත් වූ නව යෝජනා තබා ගැනීමට එකඟ විය.

ලෝක වෙළඳ සංවිධානයේ අනෙකුත් සමාජිකත්වයෙන් නිශ්චිත ප්‍රතිචාර නොමැති හෙයින්, විද්‍යුත් වාණිජ්‍ය, අයෝජන පහසුකරණය මෙන්ම සූක්ෂම, කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර වැනි ක්ෂේත්‍රයන්ගේ ගැටලු පිළිබඳ උනන්දුවක් දක්වන සමාජිකයින් අතර ගවේෂණාත්මක බහුපාර්ශවීය සාකච්ඡා ආරම්භ කිරීම පිළිබඳව විවිධ සාමාජික කණ්ඩායම් විසින් ඒකාබද්ධ අමාත්‍ය ප්‍රකාශ නිකුත් කරන ලදී.

අමාත්‍ය සම්මේලනයට අමතරව 33 කණ්ඩායම (G-33), කුඩා හා අවධානමකින් පෙළෙන ආර්ථිකයන් (SVEs), සංවර්ධනය වෙමින් පවතින රටවල නොනිල කණ්ඩායම (IGDCs) සහ විද්‍යුත් වාණිජ්‍ය මිතුරෝ (FEDs) යන අනුරූපී කණ්ඩායම් අතර පැවති කුඩා රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව උද්යෝගීව සහභාගී විය.

ඊට අමතරව, ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිත විසින් වෙළඳාම පහසුකරණය සඳහා ගෝලීය සන්ධානය මඟින් ශ්‍රී ලංකාව බහුජාතික ඒකාබද්ධ කිරීමේ කේන්ද්‍රස්ථානය කිරීම පිළිබඳ ප්‍රමුඛතා ව්‍යාපෘතිය පිළිබඳ පවත්වන ලද වැඩමුළුව අමතන ලදී.

### 3.3 ධීවර සහනාධාර සඳහා නව බහුපාර්ශවීය නීති

ප්‍රමාණයටත් වඩා සහ අධික මාළු ඇල්ලීම, නීතිවිරෝධී, වාර්තා නොවන හා නියාමනය නොවන මාළු ඇල්ලීමට (IUU) දායක වන සහනාධාර ඉවත් කිරීමට මෙන්ම 2020 වන විට එවැනි නව සහනාධාර හඳුන්වා දීම වැළැක්වීම වැනි සහනාධාර ක්‍රම සමහරක් තහනම් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 14.6 න් දැක්වේ.

සාගර සම්පත් සංරක්ෂණයට සහ එහි තිරසාරත්වයට බලපාන්නා වූ එවැනි සහනාධාර සඳහා සුදුසු පාලන පියවරයන් හඳුන්වා දීම සඳහා ලෝක වෙළඳ සංවිධානයට භාර දී ඇත. ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයින් විසින් නීතිමය බැඳීමක් ඇතිකර ගත යුතුය යන දැක්මෙන්,ලෝක වෙළඳ සංවිධානයේ නීති පිළිබඳ (සාකච්ඡා) කණ්ඩායම විසින් MC11 අමාත්‍ය තීරණ අනුව ගිවිසුමක් සකස් කිරීමේ අරමුණෙන් යුතුව ධීවර සහනාධාර පිළිබඳ මාතෘකාව සාකච්ඡා කරන ලදී.
ක්ෂේත්‍ර 3ක් අරමුණු කරගනිමින් යෝජිත සහනාධාර නීති සැකසෙනු ඇත.

අ ) IUU මාළු ඇල්ලීමට දායක වන සහනාධාර
ආ) ප්‍රමාණයට වඩා වැඩිකිරීමට දායක වන සහනාධාර
ඇ ) අධික ලෙස මාලු ඇල්ලීම සහ එවැනි තොග සඳහා දායක වන සහනාධාර

MC11 දී ප්‍රතිඵලයක් ලැබීමේ අරමුණින් විවිධ ලිඛිත යෝජනා ඉදිරිපත් කරමින් ලෝක වෙළඳ සංවිධානයේ සමාජිකයින් විසින් සාකච්ඡා සඳහා උද්යෝගයෙන් සහභාගී විය. සමාජිකයින් විසින් අමාත්‍ය තීරණ කෙටුම්පත සඳහා සම්මුතියකට එළැඹීමට අපොහොසත් වීම නිසා බුනෝස් එයර්ස් හි MC11දී වැඩිදුර සාකච්ඡා සිදු කරන ලදී. එහිදී මේ වනතෙක් සිදුකරන ලද කටයුතු දිගින් දිගටම සිදු කිරීමටත් ධීවර සහනාධාර සඳහා පවත්නා විනිවිදභාවයෙන් යුතු යාන්ත්‍රණය වර්ධනය කිරීමටත් එකඟ වන ලදී.

වසර තුල ශ්‍රී ලංකාවේ දූත මෙහෙවර විසින් රටෙහි අභිරුචීන් සුරක්ෂිත කිරීම උදෙසා සියලුම අමාත්‍යාංශ පාර්ශව සමඟින් සමීප සබඳතාවයක් සහ සහයෝගීත්වයක් පවත්වා ගනිමින් සාකච්ඡා වාර සඳහා උද්යෝගයෙන් සම්බන්ධ විය.

### 3.4 විද්‍යුත් වාණිජ්‍ය සහ තොරතුරු තාක්ෂණ ගිවිසුම

ලෝක වෙළඳ සංවිධානයේ වැඩසටහන් අතුරෙන් වඩාත් ප්‍රමුඛ ස්ථානයක් ගනු ලබන ක්ෂේත්‍රයක් වන්නේ වෙළඳාම සඳහා විද්‍යුත් වාණිජ්‍ය සහ එහි බලපෑමයි. නයිරෝබි අමාත්‍ය ප්‍රකාශනයෙන් අවධාරණය වූ පරිදි 1998 සැප්තම්බර් මස මහ සභාව විසින් සම්මත කරන ලද 'ක්‍රියා වැඩසටහන' ක්‍රියාත්මක කිරීම සඳහා පවරා දෙනු ලැබූ ලෝක වෙළඳ සංවිධානයේ ආයතනයන් විසින් ඉදිරිපත් කෙරෙනු ලැබෙන වාර්තා මත පදනම්ව මහා සභාව වාරික සමාලෝචන තබා ගත යුතු බවට උපදෙස් දී ඇත.

විද්‍යුත් වාණිජ්‍ය පිළිබඳ සාකච්ඡාවන් සඳහා ලෝක වෙළඳ සංවිධානයේ බොහෝ සාමාජිකයින් විසින් සැලකියයුතු උනන්දුවක් පෙන්නුම් කරන ලද අතර ඔවුන්ගේ නියෝජිතයන් විසින් යෝජනා ගණනාවක් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාව ද සාමාජිකයකු වන ලෝක වෙළඳ සංවිධානයේ අනුරූපී සාමාජිකයින් **14**ක කණ්ඩායමකින් සැදුම්ලත් සංවර්ධනය සඳහා විද්‍යුත් වාණිජ්‍ය මිතුරෝ කණ්ඩායම (FED) විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධනය සඳහා විද්‍යුත් වාණිජ්‍ය මඟින් ලබාගත හැකි දායකත්වය අරමුණු කරගනිමින් ඒ පිළිබඳ සාකච්ඡා දිගටම සිදුකරයි. 2017 මාර්තු මස 13 වන දින එම කණ්ඩායම මඟින් "විද්‍යුත් ගෙවීම් සහ මූල්‍ය අන්තර්කරණය" මැයෙන් එක් දින සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලද අතර ඒ සඳහා සාමාජික රටවල සතුටුදායක සහභාගීත්වයක් දක්නට විය.

2017 පෙබරවාරි මස ඩාවොස් හි පැවති ලෝක ආර්ථික සම්මේලනය අතරතුර පකිස්ථානය, ආර්ජන්ටිනාව, කොස්ටරිකා සහ නයිජීරියාව යන රටවල වාණිජ අමාත්‍යවරුන් විසින් සහභාගී වන ලද කුඩා අමාත්‍ය රැස්වීමෙන් පසුව, UNCTAD විද්‍යුත් වාණිජ සතිය හා සමගාමීව FED කණ්ඩායම විසින් පළමු FED අමාත්‍ය රැස්වීම 2017 අප්‍රේල් මස 25 වන දින ජිනිවා හි පැවැත්වීමට සංවිධානය කරන ලදී. කොළඹින් නියෝජනයක් නොමැති හෙයින් ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිත විසින් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමෙන් එයට සහභාගී වන ලදී. ඩිජිටල් බෙදීම වළැක්වීමේ මෙන්ම සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත රටවලට සංවර්ධන විසඳුම් ලබාගත හැකි මෙවලමක් ලෙස විද්‍යුත් වාණිජ්‍ය අවශ්‍යතාවය FED අමාත්‍යවරුන් විසින් පිළිගන්නා ලදී. එමෙන්ම තිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා පදනමක් වෙතැයි සැලකෙන ප්‍රධාන ගැටලු 7ක් පිළිබඳ ක්‍රමෝපාය සැලැස්මක් යෝජනා කිරීමට ද ඔවුන් එකඟ විය. මෙම ප්‍රධාන ගැටලු අතර, විද්‍යුත් වාණිජ්‍ය සූදානම සඳහා උපක්‍රම හඳුනා ගැනීම; තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ලබාගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් හා සේවා; වෙළඳ සංවිධානකරණය සහ වෙළඳාම පහසුකරණය; විද්‍යුත් ගෙවීම් ක්‍රම;නීතිමය නිශ්චිතභාවය සහ නියාමන රාමුව; ශක්‍යතා සංවර්ධනය සහ තාක්ෂණික සහය; මෙන්ම මූල්‍යකරණ ප්‍රවේශය අයත් වේ.

### 3.5 ජානමය ස්වරූපිත පේටන්ට් ආරක්ෂිත ඖෂධ සඳහා නීතිමය නිශ්චිතතාවයක් ලබාදීම පිළිබඳ WTO TRIPS ගිවිසුමෙහි සංශෝධනය

ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයින් විසින් 2005 දී ඇතිකර ගත් සම්මුතියෙන් පසු බුද්ධිමය දේපොළ ගිවිසුම සඳහා සංශෝධනය 2017 ජනවාරි 23 වන දින සිට බලාත්මක විය. මෙම සංශෝධනය මඟින් ජානමය ස්වරූපිත පේටන්ට් ආරක්ෂිත ඖෂධ සීමිත හෝ කිසිදු ඖෂධ නිෂ්පාදනයක් කළ නොහැකි රටවල් සඳහා අපනයනය කිරීමට විශේෂිත අනිවාර්ය බලපත්‍රය යටතේ නිපදවිය හැකි බවට නීතිමය නිශ්චිතතාවයක් ලබා දෙයි. අමාත්‍ය මණ්ඩලයෙන් නිසි ලෙස ලබාගත් අනුමැතියෙන් අනතුරුව ශ්‍රී ලංකාව විසින් සිය අනුමැතිය 2015 සැප්තැම්බර් මස 07 දින ලබා දෙන ලදී.

මෙම ගිවිසුම සංශෝධනය කිරීම සඳහා ලෝක වෙළඳ සංවිධානය විසින් තීරණය කර ඇත්තේ විශේෂයෙන්ම දුගී රටවල පුරවැසියන්ගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් සඳහා ගෝලීය වෙළඳ ක්‍රමයක නීති අනුවර්තනය කිරීමටයි. මෙමඟින් HIV ඒඩ්ස්, ක්ෂය රෝගයහෝ මැලේරියාව මෙන්ම අනෙකුත් වසංගත රෝග ආදිය නිවාරණයට සහයවීම පිණිස ඖෂධ නිපදවීමේ හැකියාවක් නොමැති රටවල හෝ සීමිත හැකියාවක් ඇති රටවල අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා සාධාරණ මිලකට ජානමය ස්වරූපිත ඖෂධ අපනයන නීතිමය නිශ්චිතතාවයක් ලැබෙනු ඇත. ශක්‍යතාවයෙන් යුතු අපනයනකරුවන් හා ආනයනකරුවන් යන දෙපාර්ශවයටම සුරක්ෂිත සහ ස්ථාවර නීතිමය පදනමක් මෙම සංශෝධනය මඟින් ලැබේ.

රටක් වශයෙන් මේ වනවිට ශ්‍රී ලංකාවට ඖෂධ නිපදවීමේ අංශයෙන් ඉතා සීමිත නිෂ්පාදන හැකියාවක් පවතින අතර, වසංගත රෝග, ස්වභාවික ආපදා වැනි හදිසි අවස්ථාවකදී ලොවපුරා වෙසෙන ඕනෑම

තරඟකාරී සැපයුම්කරුවන්ගෙන් මිල අධික පේටන්ට් සහිත ඖෂධ ලබා ගැනීමට මෙම නම්‍යශීලීතාවයන්ගෙන් හැකියාව ලැබෙනු ඇත.
එමෙන්ම, මෙම නම්‍යශීලීතාවය හේතුවෙන් යෝජිත ඖෂධ නිපදවීමේ කලාපය පිහිටුවීමෙන් ද, මෙම ක්ෂේත්‍රය වෙත ආයෝජකයින් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කරගැනීමෙන් ද පසු ප්‍රමාණවත් නිෂ්පාදන ශක්‍යතාවයකින් යුතු ශ්‍රී ලංකාව විසින් හදිසි අවස්ථාවකට මුහුණ දෙන වෙනත් සාමාජික රටක් වෙත ජානමය ස්වරූපිත පේටන්ට් ආරක්ෂිත ඖෂධ ලබාදීමට ද ඉදිරියේ දී හැකියාව ලැබෙනු ඇත.

### 3.6 ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන යාන්ත්‍රණයෙහි සංශෝධනය

සයවන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන යාන්ත්‍රණය සාමාජිකයින්ගේ වෙළඳ ප්‍රතිපත්ති සහ ගනුදෙනු පිළිබඳ වර්තමාන ක්‍රියාවලි සමාලෝචනය කිරීමේ දැක්මෙන් යුතුව ලෝක වෙළඳ සංවිධානයේ දී පවත්වන ලදී. වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන ආයතනය විසින් මේ පිළිබඳ සිදු කරන ලද රැස්වීම් මාලාවෙන් අනතුරුව අනුමැතිය ලබාගැනීම සඳහා මහ සභාව වෙත පහත සංශෝධන යෝජනාකොට ඉදිරිපත් කරන ලදී.

- පළමු වෙළඳ සාමාජිකයින් සිව්දෙනා (ලෝකයේ ප්‍රධාන වෙළඳ සාමාජිකයින්) - පවත්නා දෑවුරුදු චක්‍රය තුන් අවුරුදු ලෙස සංශෝධනය කිරීමට
- ඊලඟ වෙළඳ සාමාජිකයින් දහසය දෙනා - පවත්නා සිව් අවුරුදු චක්‍රය වසර පහක් ලෙස සංශෝධනය කිරීමට
- අනෙකුත් සියලු සාමාජිකයින් - පවත්නා වසර හයක චක්‍රය වසර හතක් ලෙස සංශෝධනය කිරීමට

ගිම්හාන නිවාඩුවට පෙර පැවැත්වූ ලෝක වෙළඳ සංවිධානයේ මහ සභා රැස්වීමේ දී මෙම සංශෝධන අනුමත කෙරිණි (WT/Let/1276) . ඒ අනුව 2019 ජනවාරි මස 01 දින සිට මෙම සංශෝධන බලපැවැත් වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංශෝධිත විධිවිධානයන්ට අනුව ශ්‍රී ලංකාවේ මීලඟ වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය 2023 වසරේදී වනු ඇත.

මීට අමතරව, වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයන්හි ප්‍රශ්න හා පිළිතුරු ක්‍රියාවලියේ කාල සීමාව වෙනස් කිරීමට ද සාමාජිකයින් එකඟ වූ අතර වෙනත් සාමාජිකයින්ගේ ප්‍රශ්න සඳහා හැකි ඉක්මනින් ලිඛිත පිළිතුරු ලබා දීමට පැවරුණ සමාලෝචනයට භාජනය වන සාමාජිකයන් හට පිළිතුරු සූදානම් කිරීම සඳහා අමතර සතියක් එමඟින් ලැබෙනු ඇත. තවද, වෙළඳ ප්‍රතිපත්තීන්ගේ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා,සාමාජිකයින් විසින් සිය ප්‍රතිත්පතීන්ගේ සිදුවන සුවිශේෂී වෙනස්කම් පිළිබඳ සාරාංශ වාර්තාවක් වෙළඳ අධීක්ෂණ රැස්වීම්වලදී ඉදිරිපත් කිරීමේ නිත්‍ය ක්‍රමයක පිහිටුවීම සඳහා එකඟත්වය පල කෙරෙන ලදී. මේවා තවමත් නිසිලෙස සකසා නොමැති අතර වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන ආයතනයේ සියලුම සාමාජිකයින් විසින් එකඟ වී ද නොමැත.

### 3.7 වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD):

#### 3.7.1. ඵලදායී ශක්‍යතා ගොඩනැංවීම සහ තිරසාර සංවර්ධනය සඳහා ආයෝජනය, නව නිපැයුම් සහ ව්‍යවසායකත්වය පිළිබඳ බහුවාර්ෂික රැස්වීම, 5 වන සැසිවාරය

UNCTAD හි වාර්ෂික රැස්වීම "ඵලදායී ශක්‍යතා ගොඩනැංවීම සහ තිරසාර සංවර්ධනය සඳහා ආයෝජනය, නව නිපැයුම් සහ ව්‍යවසායකත්වය පිළිබඳ උසස් මට්ටමේ ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් සම්මේලනය" 2017 ඔක්තෝබර් 09-11 දිනයන් හි ජිනිවා හි දී පැවැත්විණි. ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් හි ප්‍රතිසංස්කරණය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාම සිදු කරන ලද මෙම රැස්වීමේ පස්වන සැසිවාරයේ මුලසුන හොබවන ලද්දේ ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත/තානාපති විසිනි.

ලොව පුරා සිටින විශේෂඥයින්ගෙන් සහ 200 ට වඩා වැඩි නියෝජිතයින් පිරිසක් සම්මේලනය සඳහා සහභාගී විය. තානාපති/ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත, විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව සහ ජිනිවාහි ශ්‍රී ලංකා දූත මණ්ඩලයේ පළමු ලේකම් (වාණිජ ) විසින් මෙම රැස්වීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන ලදී. එහිදී පැවති කෙටි රැස්වීමේදී ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් ප්‍රතිසංස්කරණයේ දී ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ විසින් සභිකයෙක් ලෙස සහභාගී වන ලදී.

### 3.7.2. වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුවේ ජාත්‍යන්තර සංසදය

UNCTAD විසින් සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත රටවල වෙළඳාම පහසුකරණය සඳහා වන ප්‍රතිසංස්කරණ වලට නිරන්තර සහය ලබා දීමේ ප්‍රතිඵලයක් ලෙස, ITC, ලෝක බැංකු කණ්ඩායම, ලෝක රේගු සංවිධානය සහ ලෝක වෙළඳ සංවිධානයේ සහයෝගීත්වයෙන් වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටු සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මෙම සම්මේලනය 2017 ජනවාරි මස 23-27 දිනයන් හි ජිනීවා හිදී පවත්වන ලද අතර රටවල් 70 කින් 300 ට අධික පිරිසක් ඒ සඳහා සහභාගී විය. ශ්‍රී ලංකා රේගු අධිකාරිය, වාණිජ දෙපාර්තමේන්තුව සහ අන්තර්ජාතික වාණිජ මණ්ඩලය යන ආයතන වල නිලධාරීන් 3 ක් ශ්‍රී ලංකාවේ ජාතික කමිටුව නියෝජනය කරමින් ඒ සඳහා සහභාගී විය.

### 3.7.3. ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාණිජ්‍ය සූදානම ඇගයීම

සීඝ්‍රයෙන් වෙනස්වන්නාවූ කර්මාන්ත හා වෙළඳ පරිසරයෙන් ප්‍රතිලාභ ලැබීමේ සහ විද්‍යුත් වාණිජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහි ලා ශ්‍රී ලංකාව වෙත දායක අවධානය යොමු කරගනු ලැබීමේ අරමුණින් යුතුව ජිනිවාහි ශ්‍රී ලංකා දූත මෙහෙවර විසින් UNCTAD සහ ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී. මෙම ප්‍රයත්නයේදී, ප්‍රධානම කර්තව්‍ය වනුයේ රටක විද්‍යුත් වාණිජ්‍ය සූදානම ඇගයීම සහ පවතින වෙනස්කම් හඳුනා ගැනීමයි, එනම් වෙළඳාම පහසුකරණය, ඩිජිටල් ගනුදෙනු, කෘතිම බුද්ධිය යොදාගැනීම, දත්ත කළමණාකරණය සහ විද්‍යුත් වාණිජ්‍ය මත පදනම් වූ නිෂ්පාදන සහ වෙළඳාම ආදී සඳහා මෙවලමක් ලෙස රජයේ සහ පෞද්ගලික අංශය විසින් මෙය යොදාගැනීමට අදාල අවශ්‍යතාවයන් හඳුනා ගැනීමයි. සාකච්ඡාවන්හි මූලික අවස්ථාවේදී, ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාණිජ්‍ය සංවර්ධනය සඳහා ආයෝජකයින්ගේ අවධානය හා දායකයින් ආකර්ෂණය ලබාගැනීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාව පිළිබඳ මූලිකත්ව පදනම යටතේ තක්සේරුවක් සිදු කිරීම සඳහා UNCTAD සමඟින් එක්ව කටයුතු කිරීමට කැමති බව ලෝක බැංකුව විසින් ප්‍රකාශ කරන ලදී.

### 3.7.4. UNCTAD විද්‍යුත් වාණිජ සතිය සඳහා සහභාගී වීම

2017 අප්‍රේල් 24-28 දිනයන්හි පවත්වන ලද UNCTAD විද්‍යුත් වාණිජ සතිය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි සභාපති සහ එහි නියෝජ්‍ය අධ්‍යක්ෂ/IT ඇතුලු ජිනීවා හි ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලයේ නිලධාරීන් පිරිසක් සහභාගී විය. එහිදී ඊබේ (eBay) සමඟින් එක්ව කටයුතු කිරීමට ශ්‍රී ලංකාවේ උනන්දුව විශේෂයෙන්ම සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර සඳහා මාර්ගගත අපනයන අවස්ථාවන් ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීමට ඊබේ ආයතනයේ ගෝලීය පොදු ප්‍රතිපත්ති අධ්‍යක්ෂ හැන් මෙලින් මෙනෙවිය මුණගැසීමට නියෝජිතවරුන්ට හැකි විය. මෙම රැස්වීම අතරතුරේ දී, යුරෝපා සංගමය වෙත දේශ සීමා හරහා වෙළඳාම වර්ධනය කිරීම සඳහා යෝජනාවක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඊබේ වෙත ඉදිරිපත් කරන ලදී. දෙපාර්ශවය අතර සහයෝගීතාවය ඇතිකර ගැනීමට හැකි ආකාර මෙන්ම මෙම යෝජනාවේ ඉදිරි මාවත පිළිබඳ සාකච්ඡා සිදු වේ. 2017 ඔක්තෝබර් මස විද්‍යුත් වාණිජ්‍ය හා ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥ කණ්ඩායමේ පළමු සැසිවාරය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (SLEDB) සහකාර අධ්‍යක්ෂ/ITසහභාගී වන ලදී.

### 3.8 වෙළඳාම පහසුකරණ පිළිබඳ ගිවිසුම:

1995 දී ලෝක වෙළඳ සංවිධානය පිහිටුවීමෙන් අනතුරුව සිදු වූ සුවිශේෂී වර්ධනය වූයේ වෙළඳාම පහසුකරණ ගිවිසුම ක්‍රියාත්මක විය. 2013 දෙසැම්බර් මස ඉන්දුනීසියාවේ බාලි නගරයේ දී පැවැත්වූ නම වන අමාත්‍ය සම්මේලනයේ ඉතාම වැදගත් ප්‍රතිඵලයක් ලෙසින් වෙළඳාම පහසුකරණ ගිවිසුම හැඳින් විය හැකි වේ. එය ලෝක වෙළඳ සංගමයේ සාමාජිකයින්ගේ තුනෙන් දෙකක පිරිසක් (108) සිය දේශීය අනුමත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමත් සමඟින් නීතිමය බැඳීම ලෙස 2017 පෙබරවාරි මස 22 දින සිට බලාත්මක විය. ගනුදෙනු පිරිවැය අවම කිරීමෙන් සහ තරඟකාරීත්වය ඉහළ දැමීම තුළින් රේගු ක්‍රියාවලිය නවීකරණය සහ අනුකූලකරණය කිරීම වෙළඳාම පහසුකරණ ගිවිසුමෙහි අරමුණ වේ. මාර්ගස්ථ භාණ්ඩ ඇතුළු භාණ්ඩ මුදාහැරීම, නිශ්කාෂණය, ප්‍රවාහනය කඩිනම් කිරීම සඳාහා විධිවිධාන එහි ඇතුලත් වේ. වෙළඳාම පහසුකරණ පියවරයන්ට අදාල අධිකාරීත්වයන් අතර ඵලදායී සහයෝගීත්වයක් ඇති කිරීම සඳහා පියවරයන් අදාල වේ.

වෙළඳාම පහසුකරණ ගිවිසුම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම මඟින් වෙළඳ පිරිවැය 14.3 % සාමාන්‍යයකින් අවම කිරීමට තක්සේරු කර ඇත. තව ද ආනයන සඳහා ගතවන්නා වූ සාමාන්‍ය කාලය 47% කින් අවම කිරීමට සහ අපනයන කාලයෙන් 91% වැනි සැලකිය යුතු ප්‍රමාණයක් අවම කිරීමට එමඟින් අපේක්ෂා කෙරේ. 2030 වන විට මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම මඟින් ගෝලීය අපනයන වර්ධනය සඳහා වසරකට 2.7% කින් දායක විය

හැකි අතර එමෙන්ම සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත රටවල් සඳහා ප්‍රතිලාභ රැසක් අත් වේ. තව ද මෙම ආර්ථිකයන් තුල අපනයන භාණ්ඩ විවිධාංගීකරණය මත ධනාත්මක බලපෑම් එමඟින් ඇති වේ.

ලෝක වෙළඳ සංවිධානයේ සියලුම සාමාජිකයින් විසින් A, B, C ලෙස කාණ්ඩ වූ වෙළඳාම පහසුකරණ බැඳීම්වලට යටත් වීම වෙළඳාම පහසුකරණ ගිවිසුම (TFA) මඟින් අපේක්ෂා කෙරේ. ගිවිසුම බලාත්මක කරන කාලයේම සමාජිකයන් විසින් මෙය ක්‍රියාත්මක කළ යුතු බවට A කාණ්ඩයේ විධිවිධාන දැක්වෙන අතර B කාණ්ඩය ගිවිසුම බලාත්මක කිරීමෙන් පසු තාවකාලික කාලයකින් පසු ද C කාණ්ඩය ගිවිසුම බලාත්මක කිරීමෙන් පසු තාවකාලික කාලය ඉක්මව එක් දිනක් ඇතුලතදී සහ ශක්‍යතා ගොඩනැංවීමේ උපදෙස් සහ සහය ලබා ගැනීමේ අවශ්‍යතාවය මත ක්‍රියාත්මක කළ යුතු බවට අදාල විධිවිධානයන්ගෙන් දැක්වේ. දියුණු ආර්ථිකයින් සහ දායක ආයතන විසින් සංවර්ධනය වෙමින් පවතින සහ ඌණ සංවර්ධිත රටවල සාමාජිකයින්ට අවශ්‍යය ශක්‍යතා ගොඩනැගීම සහ බැඳීම් කාණ්ඩ C පවරා ගනිමින් කටයුතු කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දිය යුතුය.

වර්ෂය අවසානය වන විට, රටවල් 106 ක් විසින් 'A' කාණ්ඩය යටතේ බැඳීම් දැනුම් දී ඇති අතර එයින් 'B' කාණ්ඩයෙන් 43 ද 'C' කාණ්ඩයෙන් දැනුම් දීම් ඉදිරිපත් කර ඇත. ගිවිසුමේ අවශ්‍යතාවයන් අනුව, ශ්‍රී ලංකාව විසින් 'A' කාණ්ඩයේ බැඳීම් 2014 ජූලි 31 වන දින ඉදිරිපත් කරන ලද අතර එවිට ශ්‍රී ලංකාව බැඳීම් ඉදිරිපත් කරන ලද රටවලින් 39 වන ස්ථානය ලබා ගන්නා ලදී. 'A' කාණ්ඩය යටතේ ශ්‍රී ලංකාව විසින් සැපයුම් 11ක් නම් කර ඇත.

2017 පෙබරවාරි මස 'B' සහ 'C' හි ක්‍රියාත්මක කළ යුතු බැඳීම් කාණ්ඩයන්හි සැපයීම් ලැයිස්තුවට ජාතික කමිටුව එකඟ වී ඇත. කෙසේවෙතත්, සංකීර්ණ අභ්‍යන්තර ක්‍රියාවලි හේතුවෙන්, බැඳීම් කාණ්ඩ 'B' සහ 'C' දැනුම් දීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ තාවකාලික සහ නිශ්චිත දින පිළිබඳව ද ලෝක වෙළඳ සංවිධානයට දැනුම් දෙන ලද්දේ 2018 පෙබරවාරි මස 8 වන දිනයි. 'B' බැඳීම් කාණ්ඩය යටතේ සැපයුම් 2 ක් ද 'C' යටතේ 23 ක් ද ශ්‍රී ලංකාව විසින් ප්‍රකාශ කොට ඇත.

වෙළඳාම පහසුකරණ ගිවිසුම ක්‍රියාවට නැංවීමට අදාල වෙළඳ තොරතුරු බිහිදොර (TIP) සහ ජාතික තනිකවුළු වැඩසටහනෙහි ක්‍රියාවලියේ වර්ධනය සඳහා ලෝක බැංකුව සහය වේ. ලෝක බැංකු කණ්ඩායමේ තාක්ෂණික සහ මූල්‍යමය සහය ඇතිව TIP සකස්කරන ලදී. ලෝක බැංකු කණ්ඩායම විසින් පත් කරන ලද විශේෂඥ උපදෙස් සමාගම විසින් 2017 නොවැම්බර් මස අග සිට ව්‍යාපෘති දෙකක් ආරම්භ කරන ලදී. 2018 ජූලි වන විට එම ව්‍යාපෘති අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. TIP වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි.

TIP මෙහෙයවීමේ කටයුතු සිදු කරනු ලබන්නේ වාණිජ දෙපාර්තමේන්තුව විසිනි. ලෝක බැංකු කණ්ඩායම විසින් එහි වර්ධනය සඳහා වන අන්තර්ජාතික උපදෙස් සංගමයක් පත් කර ඇත. මේ වන විට PM කණ්ඩායම මඟින් එහි සැකසීම් කටයුතු සිදු කරනු ලැබේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳාම සම්බන්ධ ආයතන 55 කින් මූලික තොරතුරු ලබා ගෙන ඇත. අන්තර්ජාතික උපදේශන සංගමය ද එම ආයතන පරීක්ෂා කරන ලද අතර එම ආයතනයන්හි තොරතුරු TIP වෙත ඇතුලත් කර ඇත. මේ වන විට 20-25 % ප්‍රමාණයක තොරතුරු ඇතුලත් කර ඇත. එම ව්‍යාපෘතිය 2018 ජූලි වන විට අවසන් කිරීමට නියමිතය. එතැන් සිට ශ්‍රී ලංකා රජය විසින් එහි හිමිකම හොබවනු ඇත.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් කලින් කලට ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලබන අතර, වෙබ් අඩවියන්හි වලංගුතාවය තහවුරු කිරීම මෙන්ම එහි තිරසාර බව රැකගැනීමට අදාල පියවරයන් ගැනීම ද ව්‍යාපෘතිය රජයට භාරදුන් පසු වෙබ් අඩවි පවත්වා ගැනීම සඳහා අභ්‍යන්තර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ද සිදු කරනු ලබයි. TIP, ICTA සේවාදායකයාගේ සත්කාරත්වයෙන් දියත් කිරීමට නියමිතයි.

ශ්‍රී ලංකාවේ වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුව 2014 ජූනි මස 3 වන දින පිහිටුවන ලද අතර එය නිල වශයෙන් පිහිටු වීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2016 ජනවාරි මස අනුමැතිය ලබා දෙන ලදී. ලෝක බැංකු කණ්ඩායමේ සහාය ඇතිව එහි මහ ලේකම් කාර්යාලය පිහිටුවන ලද අතර එහි මෙහෙයුම් ආරම්භ වූයේ 2017 මැයි මස 02 දින දීය. වෙළඳාම පහසුකරණය පිළිබඳ ගිවිසුමේ බැඳීම් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීමත් වෙනත් වෙළඳාම පහසුකරණ ක්‍රම සහ ජාතික කමිටුවේ කාර්ය නිර්දේශය මෙන්ම 2017.12.07 දින අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් NTFC ලේකම් කාර්යාලය සම්මත කර ගැනීමත් සමඟ මෙම කමිටුවේ විෂය පථය පුළුල් වී ඇත. සමාලෝචනයට ලක්වන වර්ෂය තුලදී වාණිජ අධ්‍යක්ෂ ජනරාල් විසින් NTFC හි සම සභාපතිත්වය දරන ලදී.

වෙළඳාම පහසුකරණ ගිවිසුම ක්‍රියාත්මක කරවීමේ ප්‍රමුඛතා ක්‍රියාවලි සැලැස්මක් NTFC විසින් සකසා ඇත. සුවිශේෂී ක්‍රියාත්මක සැලසුම් ක්‍රමයක් සහ TFA ගිවිසුම සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන සැලැස්ම එහි ඇතුලත් වේ. ITC තාක්ෂණික සහ මූල්‍ය සහය ද ඇතුව මෙම සැලසුම; ප්‍රමුඛතාවයන් සහ ඉදිරිය, පිළිබඳ වැඩමුළුවක් 2017 ඔක්තෝබර් මස 11 දින පවත්වන ලදී.

2016 ඔක්තෝබර් මස NTFC විසින් TFA ක්‍රියාවට නැංවීමේ සැලැස්මේ දී ජාතික වෙළඳ තොරතුරු බිහිදොර සහ තනි කවුළු ක්‍රමයෙහි සැලසුම් ක්‍රියාවලිය ප්‍රමුඛතාවයක් දිය යුතු අංශ ලෙස හඳුනා ගන්නා ලදී.මෙම ව්‍යාපෘති දෙක NTFC හි සෘජු නායකත්වය යටතේ ක්‍රියාත්මක වේ. ඒ සඳහා කාර්ය නිර්දේශ ද සකස් කරන ලදී. ඒ අනුව NTFC ලේකම් කාර්යාලය විසින් TIP , NSW හි අදාල ආයතන විසින් සංවිධානය කරනු ලබන වැඩ කණ්ඩායම් රැස්වීම් මෙහෙයවීම සහ සම්බන්ධීකරණ කටයුතුවලට සහාය වීම සිදු කරන ඇත.

TIP සහ NSW සම්බන්ධයෙන් වැඩමුළු ගණනාවක් මේ වන විට පවත්වා ඇත. 2017 අගෝස්තු මස 8-9 දිනවල දී ආසියාන් ශ්‍රී ලංකා ජාතික තනි කවුළුව මනා භාවිතයන් පිළිබඳ වැඩමුළුව පවත්වන ලද්දේ වෙනත් රටවල NSW මනාව භාවිතා කරන අයුරු පිළිබඳව පාර්ශව කරුවන් දැනුවත් කිරීමට ය. ව්‍යාපෘති විශේෂඥයන් විසින් මෙම ව්‍යාපෘති වර්ධනය කිරීම සඳහා පත් වූ පසු, මේ පිළිබඳ පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා දෙවැනි අනුස්ථාපන වැඩසටහන 2017 දෙසැම්බර් මස 5 වන දින පැවැත් විය. NSW ආදර්ශයන් සකසා නිම කිරීම සඳහා යෝජිත ශ්‍රී ලංකා තනි කවුළු ආදර්ශ තෙවන වැඩමුළුව 2018 ජනවාරි 29 වන දින පවත්වන ලදී.

### 3.9 ශ්‍රී ලංකාව තුල ප්‍රපාතන විරෝධී ප්‍රතිතෝලන සහ ආරක්ෂණ පියවර පැනවීම

ප්‍රපාතන විරෝධී, ප්‍රතිතෝලන සහ ආරක්ෂණ පියවර පිළිබඳ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ජාතික කෙටුම්පත් දෙක සඳහා අනුමැතිය 2016.10.26 දින ලැබෙන ලදී. නීතිමය ආකෘතියට සැකසීම ඇතුලු සුදුසු වෙනස්කිරීම් සිදු කිරීම සඳහා එම කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත 2016.12.16 ඉදිරිපත් කරන ලදී. ප්‍රපාතන විරෝධී, ප්‍රතිතෝලන සහ ආරක්ෂණ පියවර පිළිබඳ අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙතින් 2017.02.09 දින ලබන ලදුව සුදුසු පැහැදිලි කිරීම් සහ සහතික කිරීම් ලබනු වස් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. පුළුල් මට්ටමේ පැවති උපදේශන වටයන්ගෙන් පසු, නීතිපති දෙපාර්තමේන්තුව විසින් අදාල කෙටුම්පත් සඳහා අදාල සහතික කිරීම පිළිවෙලින් 2017 අගෝස්තු සහ සැප්තැම්බර් මස ලබා දෙන ලදී. ඒ අනුව එම දෙපාර්තමේන්තුවට අදාල කෙටුම්පත් අනෙක් භාෂා දෙකින් පරිවර්තනය කිරීමට හැකි විය. එම කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකිවන ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තු සභානායක කාර්යාලය වෙත අදාල කෙටුම්පත් දෙක 2017.11.15 ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම කෙටුම්පත් පිළිබඳ 2017.12.08 දින ව්‍යාපාරික හා වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීමේ දී සාකාච්ඡා කරන ලදුව එහි දී යෝජනා කරන ලද සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත 2017 දෙසැම්බර් මස 8 වන දින ලබා දෙන ලදී. සංශෝධිත කෙටුම්පත් දෙක දෙවන වර කියවීම සඳහා 2018 පෙබරවාරි මස 23 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත අතර එය පාර්ලිමේන්තුවේ අනුමත කිරීමට පෙර ඊළඟ අදියරයන්හි යෙදිය හැකි පනත් යොදා සකසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම පනත් පැනවීමේ වැදගත්කම පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ උපදේශනාත්මක රැස්වීම් පවත්වන ලද අතර අසාධාරණ වෙළඳ ගනුදෙනු සහ අනපේක්ෂිත ආනයන ප්‍රවාහයන්ට එරෙහිව දේශීය කර්මාන්ත සහ ජාතික ආර්ථිකය සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකාව තුල මෙම පනත අනුමත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ පෞද්ගලික පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ද සංවිධානය කරන ලදී.

### 3.10 බහුපාර්ශවීය වෙළඳ ගිවිසුම් පිළිබඳ තාක්ෂණික සහය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ලෝක වෙළඳ සංවිධානයේ බහුපාර්ශවීය වෙළඳ ක්‍රමය යටතේ පවතින විවිධ ගිවිසුම් පිළිබඳ පාර්ශවකරුවන්ගේ දැනුම වර්ධනය කිරීමට සහ දැනුවත් කිරීමේ අරමුණින් යුතුව ජිනිවා හි ලෝක වෙළඳ සංවිධානය, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමඟින් එක්ව වාණිජ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් තාක්ෂණික සහය ලබා දීමේ වැඩසටහන් සහ වැඩමුළු ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී.

- ✓ **සෞඛ්‍ය හා ස්වස්ථතා ගිවිසුම් / වෙළඳාම සඳහා තාක්ෂණික සීමා පිළිබඳ ගිවිසුම**, (TBT) **2017 පෙබවාරි 20-22 කොළඹ දී**

පාර්ශවකරුවන් අතර දැනුම වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන්, ලෝක වෙළඳ සංවිධානයේ සෞඛ්‍ය හා ස්වස්ථතා ගිවිසුම් සහ වෙළඳාම සඳහා තාක්ෂණික සීමා පිළිබඳ දේශීය වැඩමුළුවක් 2017 පෙබරවාරි මස 20-22 දිනයන්හි කොළඹ දී සංවිධානය කරන ලදී. ඒ සඳහා සම්පත් දායකයින් ලෙස ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සහ පරිසර අංශයේ සහ ප්‍රමිති වෙළඳාම සහ සංවර්ධනය ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකු සහභාගී විය. විශේෂයෙන්ම ගිවිසුම යටතේ පවතින විනිවිදභාවයේ ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් හට ගිවිසුම් දෙක පිළිබඳ දැනුවත් කිරීම මෙම දින දෙක හමාරක වැඩමුළුවේ අරමුණ විය.

ආසියානු රටවල රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා සහය දීමක් වශයෙන් ප්‍රමිති පිළිබඳ වැඩමුළුවක් මෙම වැඩමුළුව හා සමගාමීව සංවිධානය කරමින් අන්තර්ජාතික ප්‍රමිති සංවිධානය (ISO) ද මේ සඳහා සහභාගී විය.

- ✓ **ලෝක වෙළඳ සංවිධානයේ තොරතුරු තාක්ෂණය ගිවිසුම පිළිබඳ ජාතික වැඩමුළුව** 2017 **ජූලි** 12-14, **කොළඹ**

ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණය කිරීම හා තක්සේරු කිරීම සඳහා මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී. ප්‍රතිපත්ති සකසන්නන්, ක්ෂෙත්‍රයේ ප්‍රමුඛයින්, සහ ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමඟ සිය විශේෂඥ දැනුම බෙදා ගැනීම සඳහා සම්පත් දායකයින් ලෙස ලෝක වෙළඳ සංවිධානයේ විශේෂඥයින් දෙදෙනෙකුගේ ශ්‍රී ලංකා සංචාරය ජිනීවා හි ශ්‍රී ලංකා දූත මෙහෙවර මඟින් සංවිධානය කෙරිණි. ශ්‍රී ලංකා පරිගණක සංගමය,SLLASCOM, FITIS විදුලි සංදේශ නියාමන කොමිසම, මොබිටෙල්, Verité Research, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, EDB, FCCISL, ICTA සහ පෞද්ගලික තොරතුරු තාක්ෂණ ආයතන කිහිපයක නියෝජිතවරුන් මෙම දෙදින වැඩමුළුව සඳහා සහභාගී වන ලදී.

- ✓ **රාජ්‍ය ප්‍රසම්පාදන ගිවිසුම පිළිබඳ දේශීය මට්ටමේ වැඩමුළුව (GPA)**, **2017 සැප්තැම්බර් 12-13, කොළඹ**

වාණිජ දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීම අනුව , ජිනීවා හි ශ්‍රී ලංකා දූත මෙහෙවර විසින් රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුවක් ශ්‍රී ලංකාවේ සිදු කිරීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ විශේෂඥ කණ්ඩායමක් ලබා දෙමට කටයුතු සලස්වන ලදී. 2003 වසරේ සිට ශ්‍රී ලංකාව මෙම රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ බහුපාර්ශවීය ගිවිසුමේ නිරීක්ෂකයෙකු ලෙස සිටි අතර ගිවිසුමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සාකච්ඡාවන් සහ එහි වර්ධනයන් උනන්දුවෙන් නිරීක්ෂණය කර ඇත.

- ✓ **කලාපීය වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික මට්ටමේ සම්මන්ත්‍රණ**, **2017 ඔක්තෝබර් 10-11, කොළඹ**

භාණ්ඩ හා සේවා වෙළඳාම, බුද්ධිමය දේපල, ආයෝජනය, වෙළඳ පිළියම්, සෞඛ්‍ය සහ ස්වස්ථතා සහ වෙළඳාම සඳහා තාක්ෂණික බාධා ආවරණය වන පරිදි ශ්‍රී ලංකාව තුල දැනට පවතින කලාපීය ගිවිසුම් පිළිබඳ පුළුල් ස්වභාවය සාකච්ඡාවල පාර්ශවකරුවන්ට මෙන්ම එයින් ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂා කරන වෙනත් පාර්ශවයන් හට ද අභියෝග රැසක් ලඟා කර දී ඇත. ඒ අනුව ඉදිරි කලාපීය ගිවිසුම් හා සම්බන්ධ වීමට අපේක්ෂා කරන රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ නියෝජිතයින්ට පහසුකම් සැලසීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ කලාපීය ගිවිසුම් පිළිබඳ විශේෂඥයින් ගේ සහභාගීත්වයෙන් සම්මන්ත්‍රණයක් කොළඹ දී පැවැත් විය.

**වාණිජ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වෙනත් ප්‍රධාන තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් පහත පරිදි වේ.**

- වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික වැඩමුළුව, 2017 අප්‍රේල් 19-20 කොළඹ දී;
- වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික වැඩමුළුව, 2017 අප්‍රේල් 24-25;
- නිදහස් වෙළඳ ගිවිසුම් භාවිතය ඉහළ දැමීම සඳහා ජාතික වැඩමුළුව, 2017 මැයි 24-25, කොළඹ දී;
- තොරතුරු තාක්ෂණ ගිවිසුම පිළිබඳ ජාතික වැඩමුළුව, ජූලි 12-13 කොළඹ දී;
- වෙළඳ සාකච්ඡා ආභාසනය පිළිබඳ ජාතික වැඩමුළුව 2017 ජූලි 24-27;
- නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා පිළිබඳ ජාතික වැඩමුළුව 2017 අගෝස්තු 1-3 කොළඹ දී;

- වෙළඳාම සහ වෙළඳ ගිවිසුම් ආර්ථිකයන් පිළිබඳ ශක්‍යතා ගොඩනැගීම සම්බන්ධ ජාතික වැඩමුළුව (I ඒකක පුහුණුව ) 2017 අගෝස්තු 23-24 කොළඹ දී;
- 'ආර්ථිකයන් සහ වෙළඳ සන්ධාන' හැඳින්වීම පිළිබඳ ජාතික වැඩමුළුව (පුහුණු ඒකක I කොටස ) 2017 අගෝස්තු 23-24 කොළඹ දී;
- රාජ්‍ය ප්‍රසම්පාදන ගිවිසුම පිළිබඳ ජාතික වැඩමුළුව, 2017 සැප්තැම්බර් 12-13, කොළඹ දී;
- ආසියානු සහ පැසිෆික් ආර්ථිකයන් සඳහා වෙළඳාම සහ පරිසරය පිළිබඳ කලාපීය වැඩමුළුව 2017 සැප්තැම්බර් 18-19 කොළඹ දී;
- ශ්‍රී ලංකා නිලධාරීන්ගේ ශක්‍යතා ගොඩනැගීමේ ජාතික වැඩමුළුව 2017 සැප්තැම්බර් 20-22, කොළඹ දී;
- ලෝක වෙළඳ සංවිධානය/ කලාපීය වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික වැඩමුළුව 2017 ඔක්තෝබර් 10-12 කොළඹ දී;
- වෙළඳාම පහසුකරණ ප්‍රතිසංස්කරණයන් ප්‍රමුඛතා වශයෙන් හා අනුපිළිවෙළින් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික වැඩමුළුව 2017 ඔක්තෝබර් 11-12 කොළඹ දී;
- වෙළඳ පිළියම් පිළිබඳ ජාතික වැඩමුළුව 2017 ඔක්තෝබර් 25-27 කොළඹ දී;
- යුරෝපීය බාහිර කටයුතු සහ ජී.එස්.පී. ප්ලස්; අනුකූලතාවය සහ භාවිතය, 2017 නොවැම්බර් 6-9 බ්‍රසල්ස්, බෙල්ජියම;
- කලාපීය නිදහස් වෙළඳ ගිවිසුමේ හොඳම යොදාගැනීම පිළිබඳ වැඩමුළුව ;
    - 2017 නොවැම්බර් 6- යාපනය
    - 2017 නොවැම්බර් 8 - මහනුවර
    - 2017 නොවැම්බර් 10 - ගාල්ල

## 4. ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව

2017 වසරේදී, ශ්‍රී ලංකාව සිය ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් සහ ශ්‍රී ලංකාව සමඟ වෙළඳාම් කටයුතු කිරීමට එළැඹි වෙනත් රටවල් සමඟ ද්විපාර්ශවීය වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමට දැඩි අවධානයක් යොමු කර ඇත. රුසියාව, යුරෝපා සංගමය, ඉරානය, ඇමරිකා එක්සත් ජනපදය, කටාර්, බංගලාදේශය හා පකිස්ථානය යන රටවල් සමඟ වෙළඳ සහ අර්ථික සබඳතාවන්ට එළැඹී ඇත. සමාලෝචනයට ලක්වන කාල සීමාවේ දී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පකිස්ථානය සමඟ අත්සන් තබන ලද ද්විපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ මෙන්ම චීනය, ඉන්දියාව සහ සිංගප්පූරුව සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් ශ්‍රී ලංකාවේ වාණිජ අභිරුචියෙහි ප්‍රගමනය සඳහා ක්‍රියාකර ඇත.

### 4.1. ඉන්දියාව වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා:

#### 4.1.1. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

ISFTA යටතේ මේ වනවිට ශ්‍රී ලංකාවෙන් 65-70% පමණ භාණ්ඩ ප්‍රමාණයක් ඉන්දියාව වෙත අපනයනය කරනු ලබයි. මෙම ISFTA මඟින් ප්‍රතිලාභ ලබන ප්‍රධාන භාණ්ඩ අතර සත්ත්ව ආහාර,කරුංකා,කුළුබඩු, ප්‍රතිචක්‍රීයකරණය කරන ලද ඉවත දැමූ කඩදාසි, කුරුඳු, ගම්මිරිස්, ගෘහභාණ්ඩ,පරිවාරික තඹකම්බි කට්ටල, ඔපදමන ලද කිරිගරුඬ, ජලය,රෙදිපිළි සහ ඇඟළුම් ද්‍රව්‍ය, පා පැදි,රබර් අත්මේස්,කඩදාසි පෙට්ටි, වායව ටයර්,MDF ලෑලි, ස්ගන්ධ තෙල් ආදිය වේ.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම පිළිබඳ සිදුකරගෙන යන්නා වූ සාකච්ඡාවන්හි අනිවාර්ය අංගයක් ලෙස අදාල දේශීය කොටස්කරුවන් සහ ඔවුන්ගේ ඉන්දියානු පාර්ශවයන් සමඟ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර භාණ්ඩ වෙළඳාමට බාධා ඇති කරන්නා වූ ඕනෑම ISFTA හා සම්බන්ධ ගැටළු විසඳීමේ කාර්යයේ දිගින් දිගටම නිරත විය. මේ පිළිබඳ 2017 වසරේ දී පැවති සාකච්ඡාවන් අතරතුර, ISFTA යටතේ අපනයනය කෙරෙන ස්ට්‍රෝබෙරි, සත්ත්ව ආහාර ආදී සමහර භාණ්ඩයන්හි රේගු නිශ්කාෂණය සම්බන්ධ ගැටලු විසඳා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය.

#### 4.1.2. ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA)

ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි හත් වන වටය ද මේ වන විට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව විසින් පවත්වා ඇත. 2017 දෙසැම්බර් 18 සිට 20 දින තෙක් කොළඹ දී පැවති 7 වන වටයේ සාකච්ඡාවන් අතරවාරයේ දී දෙරට විසින් ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම් කෙටුම්පත පිළිබඳ සිදු කෙරෙන සාකච්ඡාවන්ට අමතරව ISFTA යටතේ තීරු බදු නොවන පියවරයන්ට අදාලව පවතින යම් ගැටලු පිළිබඳ සමාලෝචනයක නිරත වන ලදී. එමෙන්ම ඒවාට අදාල පියවර ගැනීම කඩිනමින් සිදු කළ යුතු බවට නිර්දේශ කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකාව විසින් විශේෂයෙන් එහි රෙදිපිළි නිෂ්පාදන, ගම්මිරිස්, වනස්පති (හයිඩ්‍රජනීක්‍රිත එළවළු තෙල්) සහ ගාන ලද වියළි පොල් වැනි යම් යම් අපනයනයන් සඳහා ඉන්දීය රජය විසින් පනවන ලද ප්‍රමාණාත්මක සීමා කඩිනමින් ඉවත්කළ යුතු බවට අවධාරණය කරන ලදී.

භාණ්ඩ පිළිබඳ අන්‍යෝන්‍ය සංජානන ගිවිසුමේ කටයුතු ද හැකි ඉක්මනින් සිදු කර අවසාන කළ යුතු බවට ශ්‍රී ලංකාව පෙන්වන ලදී. ශ්‍රී ලංකාව විසින් අන්‍යෝන්‍ය සංජානන ගිවිසුම් කෙටුම්පතක් ඉන්දියාව වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන්දියාව විසින් එය අදාල ආයතන විසින් විමර්ශනය කරමින් පවතින බව දැනුම් දෙන ලදී. දෙරටේ අපනයනකරුවන්ට හමුවන ISFTA හා සම්බන්ධ ගැටලු කඩිනමින් විසඳා ගැනීම පහසු කිරීම සඳහා දෙරටෙහි අදාල ආයතනයන් අතර ක්‍රමවත් ආයතනික යාන්ත්‍රණයක් පිහිටුවීමේ වැදගත්කම පිළිබඳ ද ඔවුන් සාකච්ඡා කරන ලදී.

### 4.2. පකිස්ථානය වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා:

#### 4.2.1. පකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)

2005 වසරේ දී පකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) බලාත්මක කිරීමත් සමඟ දෙරට අතර සිදුවන ද්විපාර්ශවීය වෙළඳාමේ දියුණුවට එය මහත් දායකත්වයක් දක්වන ලදී.සමාලෝචනයට ලක් වූ කාලයේදී PSFTA යටතේ අපනයන කරන ලද්දේ පොල්,බුලත්, වියලි පොල්, (MDF)මධ්‍යම ඝනත්වයෙන් යුතු ෆයිබර් ලෑලි ( මි.මි. 9 ක ඝනත්වය ඉක්මවූ) සහ කළු තේ යනාදිය වේ. PSFTA යටතේ එම කාලයේදි ආනයන කරන ලද නිෂ්පාදන අතර වෙනත්, පාස්සන ලද හෝ කවාකාර යකඩ බට හෝ අමිශ්‍රිත ලෝහ, සහල්, දොඩම් (මැන්ඩරින්), පෝර්ට්ලන්ඩ් සිමෙන්ති මිටි, පිටි, ආහාර සහ සැකසූ මාළු හෝ මත්ස්‍ය ආහාර, බෙල්ලන් හෝ වෙනත් ජලජ අපෘෂ්ඨවංශීන් වේ.

### 4.3 ශ්‍රී ලංකාව සහ සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වෙළඳ සහ ආයෝජන රාමු ගිවිසුම (TIFA)

2016 අප්‍රේල් මස 28 වන දින ඇමරික එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී (Washington DC) හි පැවති සංගමයේ 12 වන සැසිවාරයේ දී දෙරටේ රජයන් විසින් ශ්‍රී ලංකාවේ සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වෙළඳාම සහ ආයෝජනය වර්ධනය කිරීම පිණිස ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් අනුමත කරන ලදී.

2017 වසරේ දී, ඉහත ගිවිසුම ප්‍රකාරව ආරම්භ කරන ලද කටයුතු හා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අදාල කටයුතු සිදු කරන ලදී.

### 4.4 නව නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම

#### 4.4.1 චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම

2014 සැප්තැම්බර් මස 16 වන දින දෙරටේ ප්‍රධානීන් විසින් අත්සන් තබන ලද චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම දියත් කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමෙන් පසු දෙරට විසින් මේ වනවිට සාකච්ඡා වට 6 ක් නිමා කර ඇත. ශ්‍රී ලංකාවට අතිශයින්ම වැදගත්වන භාණ්ඩ වෙළඳාම පරිච්ඡේදය පිළිබඳ පැවති සාකච්ඡා වටයන් හි දී ශ්‍රී ලංකාවේ වෙළඳාම් ලිහිල්කරණය මඟින් එහි දේශීය කර්මාන්තයන් මත ඇති විය හැකි බලපෑම පිළිබඳ සලකා බලමින් වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන් සඳහා විධික්‍රමයක් සැකසීම පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවක් දෙපාර්ශවය විසින් සිදු කරන ලදී.සෘණ ලැයිස්තුව සැකසීම සඳහා සිදු කරන ලද පුළුල් කර්මාන්ත සමීක්ෂණයෙන් පසුව 37% ක් වූ සංවේදී ලැයිස්තු සැකසීම සඳහා වන සාකච්ඡාවන් සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දෙනු ලබයි.

#### 4.4.2 සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම

2017 වසරේ අග වන විට, යෝජිත ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ අට වන සාකච්ඡා වටය දෙරට විසින් නිම කරන ලද අතර එම ගිවිසුමෙහි කෙටුම්පතෙහි බොහෝ ප්‍රමාණයක් දෙරට විසින් සකසා නිම කරන ලදී. එය පුළුල් ගිවිසුමක් වීම නිසාම වෙළඳාම පහසුකරණය, බුද්ධිමය දේපල, විනිවිදභාවය, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය, SPS සහ TBT , භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජනය සහ රාජ්‍ය ප්‍රසම්පාදනය සහ වෙළඳ පිළියම් ආදී බොහෝ විෂයන් ප්‍රමාණයක් එමඟින් ආවරණය වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳ පිරියම් සහ ලෝක වෙළඳ සංවිධානයට අදාල නීති සහ එයට අයත් ගිවිසුම් යන විෂයන් පිළිබඳව සාකච්ඡා මණ්ඩලය සඳහා තාක්ෂණික විශේෂඥ සහය ලබා දෙන ලදී.

### 4.5 ඒකාබද්ධ ආර්ථික කමිටු සාකච්ඡා (JEC)

වැදගත් වෙළඳ පාර්ශවකරුවන් සමඟ ශ්‍රී ලංකාව ඇතිකරගත් වෙළඳ හා ආර්ථික සහයෝගිතා ගිවිසුම් ආදියෙහි ඒකාබද්ධ ආර්ථික කමිටු සඳහා අදාල කටයුතු සිදු කරන කේන්ද්‍රීය ආයතනය ලෙස වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලබයි. ඒකාබද්ධ ආර්ථික කමිටු යටතේ ද්විපාර්ශවීය වෙළඳ ගිවිසුම් සඳහා තීරණ සැකසීම, සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම වැනි සියලුම කටයුතු වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. වෙළඳාම හා සම්බන්ධ කටයුතුවලට අවශ්‍ය තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාවය දිරිමත් කරමින් එම රටවල් වෙත ශ්‍රී ලංකාවෙන් සිදුකරන අපනයනයන් වර්ධනය කොට විස්තාරණය කිරීමට මෙම ඒකාබද්ධ ගිවිසුම් මඟින් අවස්ථාව සැලසේ.අදාල වර්ෂයේදී අමාත්‍ය/ලේකම් මට්ටමෙන් පවත්වන ලද පහත සඳහන් ඒකාබද්ධ කමිටු සඳහා සම්බන්ධීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

#### 4.5.1 ශ්‍රී ලංකාව හා රුසියාව අතර වෙළඳාම, ආර්ථිකය, විද්‍යා හා තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුවෙහි 2 වන සැසිවාරය 2017 ඔක්තෝබර් 24-26.

ශ්‍රී ලංකාව හා රුසියාව අතර වෙළඳාම, ආර්ථිකය, විද්‍යා හා තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුවෙහි දෙවන ඒකාබද්ධ කමිටු සැසිවාරය 2017 ඔක්තෝබර් මස 24-26 දිනයන් හි කොළඹ දී පැවත් වුණු අතර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ රුසියානු සමූහාණ්ඩුවේ කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය සහ ධීවර කටයුතු සඳහා ෆෙඩරල් ආයතනයෙහි ප්‍රධානී විසින් මෙහි සම අසුන් හොබවන ලදී. මෙම සැසිවාරය අතරතුර දෙපාර්ශවය විසින් මූලික වශයෙන් වෙළඳාම පිළිබඳ (වෙළඳපොළ ප්‍රවේශය හා සම්බන්ධ ගැටලු ) ආර්ථික සහයෝගීතාවය (ද්විපාර්ශවීය ගිවිසුම්, ප්‍රමිතිකරණ ක්ෂේත්‍රයේ සහයෝගීත්වය ආදිය )

ආයෝජනය, ගුවන් කටයුතු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කෘෂිකර්මය සහ ධීවර කර්මාන්තය වැනි විෂයන් ගණනාවක් පිළිබඳ සාකච්ඡා කරන ලදී.

**4.5.2 ශ්‍රී ලංකාව සහ කටාර් රාජ්‍ය අතර ඒකාබද්ධ ආර්ථික කමිටුවේ 2 වන සැසිවාරය, වාණිජ හා තාක්ෂණික කමිටුව 2017 ඔක්තෝබර් 30-31 කොළඹ .**

ශ්‍රී ලංකාව සහ කටාර් රාජ්‍ය අතර ආර්ථික වාණිජ සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ගිවිසුම යටතේ පිහිටුවන ලද වාණිජ හා තාක්ෂණික කමිටුවේ ඒකාබද්ධ ආර්ථික කමිටු 2 වන සැසිවාරය, දෙරට රාජ්‍යයන් අතර 2017 ඔක්තෝබර් 30-31 දිනයන් හි කොළඹ දී පැවැත් විය.

කටාර් රාජ්‍යයේ ආර්ථික හා වාණිජ අමාත්‍ය ගරු ශෙයික් අහ්මඩ් බින් ජසිම් බින් මොහොමඩ් අල් තානි (Sheikh Ahmad Bin Jassim Bin Mohammed Al Thani) මහතා විසින් කටාර් රාජ්‍ය නියෝජනය කරන ලද අතර ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද්දේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා විසිනි.2017 ඔක්තොබර් මස 25-26 දිනයන්හි ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් කටාර් රාජ්‍යයේ සිදු කරන ලද සංචාරය පිළිබඳ දෙපාර්ශවය විසින්ම සැලකිල්ලට ගන්නා ලදී. දෙරට අතර සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා මෙම සංචාරයේ අනෙකුත් කරුණු අතරින් LNG, ගුවන් සේවා, සංචාරක කර්මාන්ත සංවර්ධනය සහ කෘෂිකර්මාන්තය යන ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් පිළිබඳ දෙරටෙහි අවධානය යොමු කරන ලදී. ශ්‍රී ලංකාව සහ කටාර් අතර සහයෝගීතාවය ගොඩනැංවීමට හැකි ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ දෙරටේ විශේෂඥයින් සාකච්ඡා කරන ලදී. ඒ අතර වෙළඳාම, ආයෝජනය, සංචාර කටයුතු සහ විදුලි බල හා බල ශක්තිය, ප්‍රවාහනය සහ යටිතල පහසුකම්, කෘෂිකර්මය සහ පරිසරය, ශ්‍රමය, අධ්‍යාපනය, ක්‍රීඩා හා සංස්කෘතිය ආදිය වේ. දෙරට අතර දිගු කලක් පැවති මිත්‍රශීලී සම්බන්ධතාවය පෙන්වමින් කමිටුවේ දෙවන සාකච්ඡා සැසිවාරය සුහදශීලී අයුරින් පැවතිණි. දෙරටේ ද්විපාර්ශවීය සම්බන්ධතා තවදුරටත් වර්ධනය කිරීමට දෙරට තුල පැවති ප්‍රබල උනන්දුව මෙහිදී කැපී පෙනිණි.

## 5 කලාපීය ආර්ථික සහයෝගීතාව

ශ්‍රී ලංකාව, ආසියා-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA), දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) වැනි එහි කලාපීය වෙළෙඳ හා ආර්ථික ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් ලෙස තවදුරටත් කටයුතු කරන ලදී.

### 5.1 ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡා පවත්වාගෙන යාම (APTA)

ආසියා පැසිෆික් කලාපය තුල අතිකරගත් පළමු වෙළඳ ගිවිසුම වන්නේ 1975 දී අත්සන් තබන ලද බැංකොක් ගිවිසුම වන අතර එය 2005 වසරේ සිට ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම ලෙස හැඳින්වේ. තීරු බදු සහනය පිළිබඳ වූ තෙවන වටය අවසාන කරමින් 2006 සැප්තැම්බර් මස 1 දින සිට බලාත්මක කොට ක්‍රියාත්මක කරන ලදී.

APTA යටතේ සිදුකෙරෙමින් පවතින සාකච්ඡා- සිව්වන අමාත්‍ය කමිටු රැස්වීම 2017 ජනවාරි මස 13 බැංකොක් හි පවත්වන ලද්දේ සිව්වන වටයේ සාකච්ඡා අවසන් කිරීමට සහ APTA හි ඉදිරි මෙහෙයුම් සඳහා නිර්දේශයන් ලබා දීමටය. APTA වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ වාණිජ මණ්ඩල සහ කර්මාන්ත සම්මේලනය විසින් යෝජිත සහ ස්ථාවර කමිටුව විසින් නිර්දේශිත කර්මාන්ත පිහිටුවීමට අමාත්‍යවරුන් එකඟ වන ලදී.

2017 සැප්තැම්බර් මස 28-29 දිනවල පැවැත් වූ ස්ථාවර කමිටුවේ (SC) 51 වන සැසිවාරයේ දී 4 වන වටයේ සහනයන් 2018.01,01 සිට ක්‍රියාත්මක කිරීමට සහභාගී වූ රාජ්‍යයන් (PS) විසින් එකඟවන ලදී. ප්‍රභවස්ථාන සහතිකයන් හි ආකෘතිය තාක්ෂණික සංස්කරණය, නිෂ්පාදන විශේෂිත නීති හඳුන්වා දීම සහ 4 වටයේ බැඳීම් ක්‍රියාත්මක කිරීම ඇතුලත් APTA හි දෙවන සංශෝධනය සඳහා බංගලාදේශය සහ චීනය විසින් සිය අනුමත කිරීම් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවෙන් 4 වන වටයේ බැඳීම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමට නියමිත අතර එය ලද පසු රාජ්‍යතාන්ත්‍රික පාර්ශවයන් හරහා ශ්‍රී ලංකාවේ එකඟත්වය ලබා දෙනු ඇත.

### 5.2 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡා පවත්වාගෙන යාම SAFTA

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම 2004 ජනවාරි මස අත්සන් තැබීමෙන් පසු 2006 ජනවාරි මස සිට බලාත්මක විය. 1995 දී පිහිටුවන ලද දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුමත් (SAPTA) සමඟ ආරම්භ වූ වරණීය වෙළඳාම ප්‍රවර්ධනය කරමින් කලාපීය ආර්ථික සංකලනය කිරීමේ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීම SAFTA හි අභිප්‍රාය වේ.

අන්තර් කලාපීය වෙළඳාම ලිහිල්කරණය සඳහා වූ පළමු පියවර වන දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම 1993 අප්‍රේල් 11 දින අත්සන් තබන ලදුව 1995 දෙසැම්බර් මස 7 වන දින සිට බලාත්මකව ක්‍රියාත්මක විය. SAPTA ගිවිසුම අභිබවා යන SAFTA ගිවිසුම මඟින් වරණීය වෙළඳාම ප්‍රවර්ධනය කිරීම තුලින් කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරෙන අතර එය 2004 ජනවාරි මස ඉස්ලාමාබාද් හි පැවති 12 වැනි SAARC සම්මේලනයේ දී අත්සන් තබනු ලදුව 2006 ජනවාරි මස 1 දින සිට බලාත්මක කොට ක්‍රියාත්මක කරන ලදී. මෙසේ SAPTA යටතේ පැවති වරණීය තීරුබදු SAFTA මඟින් අවමකොට ප්‍රතිස්ථාපනය කෙරෙන ලදී. නිදහස් වෙළඳ අවකාශය, රේගු සංගමය, පොදු වෙළඳපොළක් සහ පොදු ආර්ථිකයක් සහ මුදල් ඒකකයක් සහිත දකුණු ආසියානු ආර්ථික සංගමයක් (SAEU) කලාපය තුල සැකසීම තුලින් කලාපයේ ආර්ථික සංහිඳියාව පුළුල් කිරීමට SAARC සාමාජිකයින් අරමුණු කරන ලදී. 2014 පැවති 18 වන SAARC සමුළුවේ දී ඒ පිළිබඳ නැවත සාකච්ඡා කරන ලදී.

SAFTA වෙළඳාම ලිහිල්කරණ තීරණ අදියර මට්ටමෙන් ක්‍රියාත්මක වේ. වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන යටතේ සංවේදී ලැයිස්තුවේ සඳහන් නිෂ්පාදන මත පැවරෙන රේගු බදු හැර අනෙකුත් නිෂ්පාදන මත පැවරෙන රේගු බදු වසර දහයක් ඇතුලතදී එනම් 2016 වන විට ක්‍රම ක්‍රමයෙන් අවමකොට සම්පූර්ණ කිරීමට නියමිතය. ඒ අනුව පළමු අදියර යටතේ තීරු බදු ලිහිල්කරණය ශ්‍රී ලංකාව විසින් 2015 නොවැම්බර් මස 21 වන දින සම්පූර්ණ කරන ලදී.

දෙවන අදියර යටතේ SAFTA රාමු ගිවිසුමේ VIII 3 (b) වගන්තියට අනුව සාමාජිකයින්ට අදාල සංවේදී ලැයිස්තුව සමාලෝචනය කරන ලදී. සාමාජිකයින් විසින් සිය මූලික සංවේදී ලැයිස්තු 20% අඩු කිරීමට එකඟ වන ලද අතර සියලුම සාමාජිකයන් විසින් එය ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ඌණ සංවර්ධිත රටවල් සඳහා අයිතමයන් 1042 සමන්විත වූ මුල් සංවේදී ලැයිස්තුවෙන් 837 ක් වන තෙක් ද ඌණ සංවර්ධිත නොවන රටවල් සඳහා 963 වන තෙක් ද ශ්‍රී ලංකාව විසින් 2014 දී අඩු කරන ලදී. සංවේදී ලැයිස්තුවෙන් ඉවත් කරන ලද නිෂ්පාදන මත රේගු බදුවල ක්‍රමික අඩුවීම 2020 වන විට සම්පූර්ණ කළ යුතු අතර එය ශ්‍රී ලංකාව විසින් 2018 අවසන්

කිරීමට නියමිතය. SAFTA යටතේ අදියර III මඟින් සංවේදී ලැයිස්තුවෙන් 20% තව දුරටත් අඩු කළ යුතු බවට 2015 යෝජනා වන ලදී. කෙසේ වුවද මෙම යෝජනාව අනුමත වූයේ හෝ ක්‍රියාත්මක වී නොමැත

සමාලෝචනය සිදු කරන කාලයේ දී SAPTA/SAFTA ට අදාල කිසිදු සුවිශේෂී සාකච්ඡාවන් සිදු වූයේ නැත.

SAARC රටවල් අතරින් ඉන්දියාව සහ පකිස්ථානය සමඟින් ඇතිකර ගත් නිදහස් වෙළඳ ගිවිසුම් හරහා ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් ගනුදෙනු සිදු කරන බැවින් SAFTA යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳාම පහළ මට්ටමක පවතී.

SAPTA යටතේ ශ්‍රී ලංකාවේ වාර්තා වූ අපනයන ප්‍රමාණය 2016 වසරට ඇඩොම් 3.40 වන අතර 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා ඇඩොම් 4.10 වේ. 2016 වසරට සාපේක්ෂව දෙවැන්නෙහි සුළු වර්ධනයක් පෙන්නුම් කෙරේ. SAPTA යටතේ ප්‍රධාන අපනයන අයිතමය වන්නේ සිදුරු රහිත රබර් ශීට් (HS 400821) ය. මේ වනවිට ඊට අමතරව වියන ලද රෙදි (580620) අපනයනය වේ. අදාල කාලය තුල 2016 සහ 2017 **(**ජනවාරි සිට නොවැම්බර්)SAFTA අපනයනයන් පිළිවෙලින් ඇඩොම් 7.52 සහ 37.61 විය. 2015 සහ 2017 කාලය තුල සමස්ත අපනයනයෙන් 80**%** ක් ගම්මිරිස් අපනයනයන්ගෙන් සමන්විත විය.

2017 වසරේදී වාණිජ දෙපාර්තමේන්තුව විසින් SAFTA යටතේ ප්‍රභවස්ථාන සහතික 687 ක් ද SAPTA යටතේ 267 ක් ද නිකුත් කරන ලදී.

### 5.3 නව කලාපීය වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡා

#### 5.3.1 බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC)

බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල් 7 න් සැදුම්ලත් බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් හි අරමුණු වන්නේ සාමජික රටවල් අතර වෙළඳ ප්‍රවාහය වර්ධනය කිරීමත් කලාපීය ආර්ථික සබඳතා මනාව පිහිටුවා ගැනීමත් ය.

BIMSTEC හි 3 වන සමුළුව, 14 වන BIMSTEC අමාත්‍ය රැස්වීම සහ 16 වන BIMSTEC ජ්‍යෙෂ්ඨ නිලධාරී රැස්වීම මාර්තු මස 1-4 දක්වා මියන්මාරයේ නේ පියී ටෝ හි පවත් වන ලදී.

අමාත්‍ය රැවීමේදී**,** සාමාජික රටවල විදේශීය අමාත්‍යවරුන් විසින් BIMSTEC හි ප්‍රමුඛ ක්ෂේත්‍රයන් ගේ ප්‍රගතිය විමර්ශනය කරන ලද අතර පහත නීත්‍යානුකූල පත්‍ර වලට අත්සන් තැබීමේ සූදානම පිළිබඳව ද ප්‍රකාශ කරන ලදී.

- BIMSTEC ස්ථාවර ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා සාංගමික සංස්ථා පත්‍රය
- BIMSTEC සංස්කෘතික කර්මාන්ත කොමිසම සහ BIMSTEC සංස්කෘතික ආයතන නිරීක්ෂණාගාරය පිහිටුවීම සඳහා අවබෝධතා ගිවිසුම
- කාළගුණය හා දේශගුණය පිළිබඳ BIMSTEC මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා BIMSTEC සාමාජික රටවල සාමාජිකයින් අතර සාංගමික සංස්ථා පත්‍රය

මීලඟ වෙළඳ හා ආර්ථික අමාත්‍ය රැස්වීම අතරවාරයේ දී පහත ගිවිසුම් සඳහා අත්සන් තැබිය යුතු බවට ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ දී එකඟ වන ලදී.

- BIMSTEC නිදහස් වෙළඳ අවකාශය පිළිබඳ රාමු ගිවිසුමෙහි භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම
- BIMSTEC නිදහස් වෙළඳ අවකාශය පිළිබඳ රාමු ගිවිසුම සංශෝධනය කිරීම සඳහා නියමාවලිය
- රාමු ගිවිසුමෙහි ආරවුල් විසඳීමේ ක්‍රම සහ යාන්ත්‍රණයන් පිළිබඳ ගිවිසුම
- රේගු සම්බන්ධ කටයුතුවලදී සහයෝගිතාවය සහ අන්‍යෝන්‍ය සහය පිළිබඳ ගිවිසුම

සාමාජික රාජ්‍යයන් විසින් එකඟ වන ලද ආකෘතියට අනුව පාර්ශවකරුවන්ගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකාවේ වෙළඳාම පහසුකරන වැඩසටහන සකස්කරන ලදී. ඒ අනුව BIMSTEC ලේකම් කාර්යාලය වෙත එය ඉදිරිපත් කරන ලදී. ඒ අතරතුර දී BIMSTEC ලේකම් කාර්යාලය විසින් සාමාජිකයින්ගේ අර්ථ දැක්වීම් පිණිස 'ප්‍රභවස්ථාන නීති සහ BIMSTEC නිදහස් වෙළඳ අවකාශය මෙහෙයුම් සහ සහතික කිරීමේ ක්‍රියාවලි පිළිබඳ ලිඛිත කෙටුම්පතක් ද ' BIMSTEC කලාපය සඳහා වෙළඳාම පහසුකරණය' පිළිබඳ ලිඛිත කෙටුම්පතක් බෙදාහරින ලද අතර එහි නිරීක්ෂණයන් සිදුකෙරෙමින් පවතී.

### 5.3.2 ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA)

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) යනු, ඉන්දියානු සාගර වටද්දර රටවල් අතර සහයෝගීතාව සහ සමීප අන්තර් ක්‍රියාකාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ විද්වත් ප්‍රජාව යන ත්‍රෛපාර්ශ්වයන් එකට කැටුව, එම රටවල් අතර පිහිටුවා ගන්නා ලද කලාපීය සංසදයකි. වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI), ඉන්දියානු සාගර වටද්දර රටවල ව්‍යාපාරික සංසදය (IORBF) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යයන කණ්ඩායම (IORAG) යනාදී වශයෙන්, පාර්ශ්ව කණ්ඩායම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් මේ යටතේ පිහිටුවා ඇත. කලාපයේ සහ සාමාජික රාජ්‍යයන්ගේ තිරසාර වර්ධනය සහ තුලිත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කලාපීය ආර්ථික සහයෝගීතාව උදෙසා පොදු පදනමක් ඇතිකිරීම සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) විසින්, (i) සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතතාව, (ii) වෙළඳාම් සහ ආයෝජන පහසුකරණය, (iii) ධීවර කළමනාකරණය, (iv) ආපදා අවදානම් කළමනාකරණය, (v) අධ්‍යයන, විද්‍යා හා තාක්ෂණ, (vi) සංචාරක හා සංස්කෘතික හුවමාරු (vii) කාන්තා සවිබල ගැන්වීම (viii) සමුද්‍රීය ආර්ථික යනාදී ප්‍රමුඛ ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත.

2017 වසර තුල සිදු වූ සුවිශේෂී කටයුතු අතර, IORA සිය 20 වැනි සංවත්සරය සමරන ලදී. වත්මන් සභාපතිත්වය වශයෙන් ඉන්දුනීසියාව විසින් ජකර්තා හි පළමු නායක සමුළුව 2017 මාර්තු මස පවත්වන ලදී. එහි තේමාව වූයේ "නිදහස්, ස්ථාවර සහ සමෘධිමත් ඉන්දියන් සාගරයක් උදෙසා සමුද්‍රීය සහයෝගීතාවය ශක්තිමත් කිරීම" යි. ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා මෙම නායක සමුළුව සඳහා සහභාගී වන ලදී. 17 වන IORA අමාත්‍ය කවුන්සිලයේ රැස්වීම (COM) ඔක්තෝබර 14-18 දිනයන් හි දකුණු අප්‍රිකාවේ ඩර්බන් හි පවත් වන ලදී. ඒ සමඟ, 23 වන IORA ව්‍යාපාරික සංසදය (IORBF) ඔක්තෝබර් 14 දින ද වෙළඳාම හා ආයෝජනය පිළිබඳ වැඩ කණ්ඩායමේ (WGTI) 17 වන රැස්වීම් වාරය ඔක්තොබර් 15 දින ද 19 වන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුව (CSO) ඔක්තෝබර් 16-17 දිනයන් හි ද පවත්වන ලද අතර ඉන්දියානු සාගර පිළිබඳ සංවාදය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි හි දී ඔක්තෝබර 9-10 දිනවල පවැත්වීම ද සංවිධානය කරන ලදී.

### 5.3.3 සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)

2010 අප්‍රේල් මාසයේදී භූතානයේදී පවත්වන ලද 16 වැනි සාර්ක් සමුළුව අතරතුර දී සාමාජික රාජ්‍යයන්ගේ නායකයින් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම් කෙටුම්පත අත්සන් කරන ලදී. සියලුම රටවල් මෙම ගිවිසුම සඳහා එකඟතාව පළ කරන ලද අතර සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා ජාතික බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතවන ලදී.

SATIS හි විශේෂඥ කණ්ඩායම් රැස්වීම් කිසිවක් මෙම වර්ෂයේ දී නොපැවත්විය.

SATIS යටතේ ශ්‍රී ලංකාවේ සේවා යෝජනාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර SATIS යටතේ සිය සේවා යෝජනාවලිය සූදානම් කර ඇති බවට ශ්‍රී ලංකාව විසින් SAARC මහ ලේකම් කාර්යාලය දැනුවත් කරන ලදී. කෙසේ වුවත් බැඳීම ලේඛණයන්ගේ අවසාන කෙටුම්පත සභාගත වන්නේ සියලුම සාමාජිකයන් තමන්ගේ යෝජනාවලි ඉදිරිපත් කර අවසන් වූ පසුවයි.

### 5.4 ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) පිළිබඳ ගිවිසුම 1989 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) යනු, දකුණ - දකුණ අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි (UNCTAD) අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි. GSTP ගිවිසුමේ 30 වන වගන්තිය අනුව 2017 අගෝස්තු මස සිට බලපැවැත්වෙන පරිදි කොළොම්බියාව ඉවත් වන තුරු එහි සහභාගීත්ව සමාජිකයින් 43 ක් සිටින ලදී.
මේ වනවිට, GSTP හි සහභාගී වූ සාමාජිකයන් අතර වෙළඳ සාකච්ඡා වට තුනක් පවත්වන ලදී. 2004 දී බ්‍රසීලයෙ සාඕ පාවුලෝ හි පවත්වන ලද UNCTAD XI අවස්ථාවේ දී දියත් කරන ලද සහ 2014 දී නිශ්චය කර අවසන් කරන ලද 'සාඕ පෝලෝ වටය (Saŏ paulo)' ආසන්නම සාකච්ඡා වටය වේ. GSTP සාමාජිකයින් අතුරෙන් 22 ක් ඒ සඳහා සහභාගී වන ලදී. ඒ අතුරෙන් සාමාජිකයින් 11ක් විසින් 2010 සාඕ පෝලෝ තුන්වන වටයේ දී අවසන් නියමාවලියට අත්සන් තබන ලදී. මේ වනවිට එම 11දෙනා අතුරෙන් කියුබාව, ඉන්දියාව, මැලේසියාව සහ උරුගුවේ (මකෝසර්හි කොටසක් Mercosur) තෙවන වටයේ වෙළඳ ගිවිසුම අනුමත කර ඇත. GSTP සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව තෙවන වටයට සහභාගී වූ එම සාමාජිකයින් 22 නා අතර සිටියද සාඕ පෝලෝ නියමාවලියට අත්සන් තැබූවකු නොවේ.

## 6. වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය

### 6.1 විදේශ වාණිජ නියෝජනය

විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල 28 ක නිලධාරීන් 30 දෙනෙකුගෙන් සමන්විත වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධාණය යොමු කරමින් සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීමෙහිලා නිරතවන ලදී. "රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන" යටතේ වාණිජ නිලධාරීන් විසින් ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් ක්‍රියාවට නංවනු ලැබේ. ශ්‍රී ලාංකික අපනයන සඳහා ජාත්‍යන්තර වෙළඳපළ තවදුරටත් පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පිහිටි අනෙකුත් සහාය ව්‍යාපාරික සංවිධානවල සහයෝගය ඇතිව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පෙළක් ක්‍රියාවට නංවන ලදී. නව අපනයන වෙළඳපළ හඳුන්වාදීම සහ පවත්නා වෙළඳපළවල වඩාත් යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඔවුනගේ වෙළඳපළ කොටස පුළුල් කිරීම සඳහා ප්‍රමුඛ අපනයනකරුවන් වෙත මූලික අවධානය යොමුකරන අතරතුර, වාණිජ නිලධාරීන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් වෙත ඔවුනගේ නිෂ්පාදන වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීම සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී.

විදේශයන්හි සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා අපනයන අවස්ථාවන් හඳුනාගැනීම සඳහා වෙළඳපළ සමීක්ෂණ/ තොරතුරු සම්පාදනය කිරීම.
- සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්, විශේෂයෙන් තීරුබදු සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම. මෙය, ශ්‍රී ලාංකික අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා වඩාත් ඵලදායී මෙවලමක් වශයෙන් සළකනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ පවත්වන ලද ප්‍රදර්ශන/අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සංවිධානය කිරීම.
- සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත වෙළඳ, ආයෝජන සහ සංචාරක දූත පිරිස් සංවිධානය කිරීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත පුද්ගල ව්‍යාපාරික සංචාරයන් සංවිධානය කිරීම.
- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍ර වලට අදාළ රජයේ නිලධාරීන් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු වලට අදාළ ගැටළු/ කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය සහ ජාත්‍යන්තර සංවිධාන වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- වෙළඳ, ආයෝජන සහ සංචාරක ආශ්‍රිත වෙළඳ විමසුම් සම්බන්ධයෙන් සේවය සැපයීම, විදේශ ව්‍යාපාරිකයින් හමුවීම/ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ වෙළඳ ආරවුල් විසඳීම යනාදිය.

| | ක්‍රියාකාරකම | | මුළු එකතුව |
|---|---|---|---|
| 1 | සත්කාරක රටවල්වල ශ්‍රී ලංකා-විශේෂී (තනි රට ) ප්‍රවර්ධන වැඩසටහන් (වෙළඳාම/ ආයෝජන / සංචාරක ) | | 102 |
| 2 | ශ්‍රී ලංකාව වෙත සිදු කරන ලද දූත මෙහෙයුම් | නියෝජන ගණන | 68 |
| | | නියෝජිතයින් ගණන | 466 |
| 3 | සත්කාර රටවල් වෙත ශ්‍රී ලංකාවෙන් සිදු කරන ලද දූත මෙහෙයුම් | නියෝජන ගණන | 137 |
| | | නියෝජිතයින් ගණන | 1,438 |
| 4 | ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාර | | 210 |
| 5 | සත්කාරක රට වෙත පුද්ගල සංචාර | | 207 |
| 6 | සත්කාරක රටවල සිදු කරන ලද ප්‍රදර්ශන | | 92 |
| 7 | ශ්‍රී ලංකාව තුල පැවති ප්‍රදර්ශන සඳහා සත්කාරක රටවල සහභාගීත්වය | ප්‍රදර්ශන/සල්පිල් ගණන | 47 |
| | | සහභාගී වූවන්/ ප්‍රදරශනකරුවන් ගණන | 499 |
| 8 | පිළිතුරු දුන් වෙළඳ විමර්ශන සංඛ්‍යාව (වෙළඳ/ආයෝජන/සංචාරක ) | | 1,918 |
| 9 | විසඳුම් ලබා දුන් වාණිජ ගැටලු/ ආරවුල් සංඛ්‍යාව | | 178 |
| 10 | ප්‍රවර්ධනය කරන ලද නිෂ්පාදන ක්ෂේත්‍ර ප්‍රමාණය | | 46 |
| 11 | සත්කාරක රටවල්වල වාණිජ නිලධාරීන් විසින් සහභාගී වන ලද ප්‍රදර්ශන/සල්පිල් | | 54 |
| 12 | සත්කාරක රටවල වෙළඳාම පහසුකරණ සහ ව්‍යාපාර ජාලගත රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය | | 77 |
| 13 | ජාත්‍යන්තර සම්මේලනයන් හි ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | | 17 |
| 14 | ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන කටයුතු | | 109 |

### 6.1.1 කාර්ය සාධන ඇගයීමේ ක්‍රියාමාර්ගයන්

### අපනයන ප්‍රවර්ධනය

වාණිජ දූත මණ්ඩල නිලධාරින් විසින් ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැස්වීමේ අන්තර් සම්බන්ධතාවය සිදු කිරීමට අමතරව විදේශ ඇණවුම් සුරක්ෂිත කිරීමේ සාර්ථකත්වය පහත කරුණු මත රඳා පැවතෙනු ඇත. එම කරුණු සඳහා වාණිජ නිලධාරීන් හට මැදිහත් වීමක් සිදු කළ නොහැකිය. රටක ඉහත සඳහන් කරන ලද සූක්ෂම සහ සාර්ව කරුණු හිතකර අයුරෙන් පැවතීම වාණිජ නිලධාරීන්ගේ කර්තව්‍ය වඩාත් කාර්යක්ෂම කරනු ඇත.

| සූක්ෂම කරුණු | සාර්ව කරුණු |
|---|---|
| සමාගමෙහි සාමාන්‍ය අපනයන සූදානම/ උනන්දුව | තරඟකාරී ආර්ථිකය තුල අඩු නිෂ්පාදන පිරිවැය |
| තරඟකාරී මිල (වෙනත් සැපයුම්කරුවන් සමඟ තරඟ කිරීම ) | තාක්ෂණය සඳහා සිදුකරන ආයෝජන මට්ටම් සහ නව නිපැයුම් මට්ටම |
| නිෂ්පාදනයේ ගුණාත්මක භාවය | රටෙහි සම්පත් උරුමය |
| සැපයුම් ධාරිතාවය - විශාල ඇණවුම් ප්‍රමාණයක් කලට වේලාවට සහ සාමාන්‍ය අයුරින් සම්පූර්ණ කිරීමේ හැකියාව | වෙළඳ පහසුකම් මට්ටම |
| ආනයන රටවල පවත්නා නීති රීතිවලට අනුකූල වීම | අයවැය හැකියාව |
| මූල්‍ය ප්‍රවර්ධන හැකියාව | |

## 6.2 වෙළඳ සල්පිල් සඳහා සහභාගීත්වය

### 6.2.1. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය

කර්මාන්ත තාක්ෂණ සහ අපනයන තරඟකාරීත්වය ඉහළයාමේ මට්ටමක පවතින අවස්ථාවක, ව්‍යාපාරික පාර්ශවකරුවන් හමුවන ඵලදායී වෙළඳපොළ ස්ථානයක් ලෙසත්, තොරතුරු හුවමාරු කිරීමේ සහ ව්‍යාපාර පුළුල් කිරීමේ ස්ථානයක් ලෙසටත් වෙළඳ සල්පිල පත්ව ඇත.

ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයේ වැදගත්කම හඳුනාගනිමින්, වර්ෂය තුල දී මෙම දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කරන ලදී.

- සිලෝන් තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදන, ශ්‍රී ලංකාවේ කුළුබඩු සහ මුහුදු ආහාර ප්‍රදර්ශනය කරමින් ශ්‍රී ලාංකික සමාගම් හතරක් විසින් මොස්කව් හි පැවති "වර්ල්ඩ් ෆුඩ් 2017" (world Food 2017)සඳහා සහභාගී වන ලදී.
- ආහාර, පානවර්ග යන ක්ෂේත්‍ර නියෝජනය කරමින් ශ්‍රී ලාංකික සමාගම් පහක් විසින් ජෙඩා හි පැවති "ෆුඩෙක්ස් සෞදි" (foodex saudi) සඳහා සහභාගී වන ලදී.
- ආහාර, පානවර්ග යන ක්ෂේත්‍ර නියෝජනය කරමින් ශ්‍රී ලාංකික සමාගම් හයක් විසින් ස්වීඩනයේ පැවැත් වූ "නොර්ඩික් කාබනික ආහාර සල්පිල" සඳහා සහභාගී වන ලදී.
- ඇ.එ.ජ- වොෂින්ටන් හි පැවති කොෂර්ෆෙස්ට් සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් තුනක් ඔවුන්ගේ නිෂ්පාදනයන් සඳහා කොෂර් සහතික සහිතව සහභාගී විය .

වෙළඳ සල්පිල් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය හා සමගාමීව අදාල රටවල දූත මෙහෙවර විසින් ශ්‍රී ලංකාවේ සහභාගීත්වයන් සඳහා සමාගම් ව්‍යුහ ඉදිරිපත් කිරීමට සහ ඵලදායී ව්‍යාපාර සම්බන්ධතාවයන් ගොඩනගා

ගැනීම සඳහා අවස්ථාවන් ලබා දුන් එම රටවල ව්‍යාපාරික නියෝජනයන් සහ රාජ්‍ය නිලධාරීන් සමඟ ව්‍යාපාර ජාලකරන සැසිවාර සංවිධානය කරන ලදී.

තෝරාගත් ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීමට අමතරව දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම යටතේ, විදේශ රටවල ස්ථාපිත වාණිජ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ආයතනය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වැනි ශ්‍රී ලාංකීය ආයතනයන්ගේ සහය ද ඇතිව ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා පහසුකම් සලසන ලදී.

විදේශ රටවල ස්ථාපිත වාණිජ නිලධාරීන් විසින් අනෙකුත් ශ්‍රී ලාංකික ආයතයන් හි සහාය ලබා ගනිමින් 2017 වර්ෂය තුලදී පහත දැක්වෙන ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සංවිධානය කරන ලදී.

- සිඩ්නි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ පොල් සංවර්ධන අධිකාරියේ ද සහය ද ඇතුව සිඩ්නි ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානයෙහි 2017 සැප්තැම්බර් මස 11-14 දිනයන්හි පැවති ආහාර ප්‍රදර්ශනයෙහි රට නියෝජනය වන මණ්ඩප සංවිධානය කිරීම.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සහ ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය එක්වීමෙන් 2017 මැයි මස 23 වන දින ත්‍රොකදෙරෝ (Trocadéro) හි ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ තනි රට ප්‍රදර්ශනයක් පැවැත්වීම. ප්‍රමුඛපෙළේ ආයතන හයක් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඒ සඳහා සහභාගී විය.

- අපනයන සංවර්ධන මණ්ඩලය සමඟින් එක්ව වාණිජ අංශය 2017 සැප්තැම්බර් 18-21 දිනයන්හි පැවති රෙදිපිළි නිෂ්පාදන සැපයුම් ප්‍රදර්ශන සල්පිළ සඳහා ප්‍රථමවතාවට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කරන ලද අතර ඇඟළුම් අපනයනකරුවන් 8 ක් සහ නිර්මාණකරුවන් 3ක් ඒ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන ලදී.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, පකිස්ථාන් ශ්‍රී ලංකා කොන්සුලර් ජනරාල්ගේ සහායද ඇතිව "එක්ස්පෝ පකිස්ථාන්" සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කරන ලද අතර ඒ සඳහා ගෘහභාණ්ඩ, පෝසිලේන්, රසායනික, තේ, අත්කම්, පොල් සහ ආශ්‍රිත නිෂ්පාදන, ඇඟළුම්, ඖෂධීය ආලේපන සහ රූපලාවන්‍ය නිෂ්පාදන යන ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් ශ්‍රී ලංකා සමාගම් 14 ක් සහභාගී විය.

සත්කාරක රටවල සිටින වාණිජ නිලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ සංවිධානය කෙරෙන වෙළඳ ප්‍රදර්ශන සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දීමට අමතරව ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට නව ව්‍යාපාරික අවස්ථා සොයා බැලීම පිණිස ඔවුන් එම රටවල වෙළඳ ප්‍රදර්ශන සඳහා ද නිරන්තරයෙන් සහභාගී වෙයි.

### 6.3. විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය

විදේශ රටවල ස්ථාපිත වාණිජ නිලධාරී විසින් රට තුලට විදේශීය සෘජු ආයෝජන ලබාගැනීමෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. එහිදී ඔවුන් විසින් ප්‍රධාන පෙලේ ආයෝජකයන් සහ අයෝජන ආයතන සමඟ මනා සම්බන්ධතාවයක් පිහිටුවා ගනු ලබයි.
මීට අමතරව ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත වඩාත් පුළුල් කිරීම සඳහා බලවත් බද්ධ ව්‍යාපාර පාර්ශවකරුවන් හඳුනා ගැනීමට ශ්‍රී ලංකාවෙන් පරිබාහිර ව්‍යාපාරික නියෝජිතයන් සමඟ ව්‍යාපාර හමු සංවිධානය කිරීමද ඔවුන් සිදු කරනු ලබයි.

ඒ අනුව අදාල වර්ෂයේදී, වාණිජ නිලධාරීන් විසින් එක් එක් ක්ෂේත්‍රයට අදාල සවිමත් ආයෝජකයන් හමු වී දිවයිනෙහි පවතින ආයෝජන අවස්ථා පිළිබඳ විස්තර සැපයීමට කටයුතු කර ඇත.

- ශ්‍රී ලංකාව තුළ පවතින අනාගත ආයෝජනයන්ගේ ශක්‍යතා අධ්‍යනයක් සඳහා 2017 පෙබරවාරි 20-23 වන දිනයන්හි ඉකෙයා (IKEA) සමාගමේ ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කිරීමට ස්වීඩන් දූත මණ්ඩලයට හැකි විය. ඉන් පසු වසරේ පළමු සහ දෙවන කාර්තු තුළදී ඉකෙයා සමාගම විසින් දෙවරක් ශ්‍රී ලංකාවට පැමිණෙන ලද අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සමාගම් සමඟ හමුවීම් කිහිපයක් ද පැවතිණි. ඔවුන් ශ්‍රී

ලංකාවෙන් රබර් නිෂ්පාදන මිලදී ගැනීමට උනන්දුවෙන් පසු වන අතර ලාලන් රබර් පෞද් සමාගම සහ ඩෙල්මේජ් ෆෝසිත් සහ පෞද් සමාගම යන රබර් කර්මාන්ත ශාලාවන් ද රබර් දැව භාණ්ඩ සඳහා ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම සඳහා රබර් වත්තක් ද මෙහිදී නිරීක්ෂණය කරන ලදී.

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සමාගමක් සමඟ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම සඳහා සාකච්ඡා පවත්වන ලදී. ඒ සඳහා ඇ.ඩො 500,000/= ක ආයෝජනයක් අපේක්ෂා කෙරේ. එම සමාගම විසින් ලබා දුන් ව්‍යාපාර යෝජනාව ආයෝජන මණ්ඩලය වෙතට ඉදිරිපත් කරන ලද අතර අරාබි සමාගම විසින් සිය සමාගම ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම සඳහා සුදුසු පරිසරයන් සෙවීම සඳහා ශ්‍රී ලංකාවෙහි සංචාරයක නිරත වන ලදී.

- 2017 ශ්‍රී ලංකාවට ආයෝජනය කරන්නන්ගේ සම්මේලනය සිඩ්නි - ශ්‍රී ලංකාවට විදේශීය සෘජු ආයෝජන ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළඳපොළ හා එක්ව ඕස්ට්‍රේලියානු ශ්‍රී ලංකා දූත මෙහෙවර සමඟින් ප්‍රචාරණ වැඩසටහනක් දියත් කරන ලදී. එම සම්මේලනය 2017 මාර්තු 20 දින සිඩ්නි නගරයේ දී පැවැත්වූ අතර 150 ට වැඩි අරමුදල් කළමණාකරුවන් ද ශ්‍රී ලංකා ඩයස්පෝරාව ද DFAT හි ඕස්ට්‍රේලියානු රජයේ නිලධාරීන් ද එයට සහභාගී විය.

- ශ්‍රී ලංකා සංචාරයක්, ඕස්ට්‍රේලියා-ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් කොන්සාල්වරයාගේ උපකාරයද ඇතිව සූදානම් කරන ලදී. පුද්ගලයන් අටකින් යුතු එම නියෝජිතයින් ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ සමාගම් සමඟ ඕස්ට්‍රේලියානු ඩොලර් 500,000 ක මුදලක ආයෝජනයන් සහ එම ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා 15ක් ලබා දීමේ ගිවිසුම්වලට එළැඹෙන ලදී.

- ඊජිප්තුවේ කයිරෝ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඊජිප්තුවේ නව ආයෝජනයක් වන ඊජිප්තු හෙගසි කණ්ඩායම (Hegazy Group) සහ ශ්‍රී ලංකාවේ සැම්සන් සමාගම (Samson compound Company) අතර ඒකාබද්ධ ව්‍යාපාරික ව්‍යාපෘතියක් සඳහා සහය දක්වන අතර ඊජිප්තු මෝටර් රථ කර්මාන්තයට සහ අප්‍රිකාවේ වෙනත් ප්‍රාන්තයන්ට අවශ්‍යවන රබර් මෝටර් රථ කොටස් කෙරෙහි නිෂ්පාදන ක්ෂේත්‍රය සිය අවධනය යොමු කර ඇත. හෙගසි කණ්ඩායම සඳහා අප්‍රිකා මහද්වීපයේ මෝටර් රථ නිෂ්පාදකයින්ට වෙළඳපොළ ප්‍රවේශය ලබා ගැනීමත් DSI සමාගමට අයිති රබර් ආශ්‍රිත මෝටර් රථ කොටස් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික දැනුම ලබාගැනීමත් යන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන මෙම ඒකාබද්ධ ව්‍යාපාරය ආරම්භ කෙරෙනු ඇත.

- ටෝකියෝ හි වෙළඳ අංශය විසින් ජපානයේ තේ ආනයන කරන ප්‍රමුඛ සමාගමක් වන කුනිතරො පෞද්. සමාගම (M/s Kunitaro Co Ltd.) සමඟ හමුවක් පවත්වන ලදී. එම සමාගම ශ්‍රී ලංකාවෙන් කාබනික තේ ගෙන්වීමට ඉතා උනන්දුවෙන් පසු වේ. ජපානයේ වෙළඳපොළ අවශ්‍යතාවන්ට සරිලන සැපයුමක් ලබා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ලබා දීමට ද එම සමාගම එකඟ විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහය ඇතිව බයෝෆුඩ් (Biofood) සහ ග්‍රීන්ෆීල්ඩ් (Greenfeild) යන ප්‍රධාන කාබනික තේ නිෂ්පාදකයින් සමඟ එම සම්බන්ධ කිරීමට ශ්‍රී ලංකා දූත මෙහෙවර සමත් විය. ජපාන සමාගම විසින් නොවැම්බර් මස තුල ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදෙනු ඇත.

- බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ වෙළඳ නිලධාරියාගෙන් ලද සහයෙන් පසු මාර්ක්ස් ඇන්ඩ් ස්පෙන්සර් (Marks and Spencer) හි සේවය කරන බ්‍රිතාන්‍ය තනි ආයෝජකයෙක් විසින් සේවකයින් 250 ක් සමඟින් ම කල්පිටියේ ඇඟළුම් කම්හලක් ඔහු සතු කරගන්නා ලදී. එහි වත්මන් මෙහෙයුම් තවත් වැඩි කිරීමට සහ නව සේවකයින් ලඟදීම බඳවා ගැනීමට ඔහු සැලසුම් කරයි. කුලියාපිටිය නගරයට ආසන්නයේ ද කුඩා කර්මාන්තයක් එම ආයෝජකයා සතුව පවතින අතර එහි මෙහෙයුම් නගා සිටුවමින් ඉඩකඩ සහිත නව ස්ථානයකට ගෙන යාමට ද ඔහු අපේක්ෂා කරයි. එමඟින් රැකියා අවස්ථා 125-130 ක් අතර ප්‍රමාණයක් ඇතිවනු ඇත.

## 6.4. සංචාරක ප්‍රවර්ධනය

වාණිජ නිලධාරීන් විසින් සංචාරක ක්ෂේත්‍රයේ විභවීය ලක්ෂණ හඳුනා ගනිමින් ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහයද ඇතිව, විදේශ රටවල් තුල විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලබයි. විශේෂ සංසද සහ සම්මේලන සංවිධානය, සංචාරක කණ්ඩායම් සඳහා සංචාර සංවිධානය, සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සූදානම් කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දීම, මාධ්‍ය නියෝජන, ශ්‍රී ලංකාව වෙත FAM සංචාර, සංචාර ප්‍රවර්ධන මණ්ඩල පිහිටුවීම, සත්කාරක රට තුල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්ගෙන් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම ආදිය ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා වාණිජ නිළධාරීන් විසින් අනුගමනය කරනු ලබන ප්‍රධාන ක්‍රමෝපායන් වේ.

සමාලෝචනයට ලක්වන කාල සීමාව තුල වාණිජ නිළධාරීන් විසින් විවිධ රටවල පැවත් වූ චාරිකා සහ සංචාරක ප්‍රදර්ශන 47 ට සහභාගීවීමට ශ්‍රී ලංකාවේ 500 ට වැඩි චාරිකා හා සංචාරක සමාගම් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ගුවන් සේවා සඳහා සම්බන්ධීකරණ කටයුතු සහ අවස්ථාව ලබා දෙන ලදී.

පොදුවේ සහ සංචාරක ක්ෂේත්‍රය අතර සංචාරක ප්‍රවර්ධනය සඳහා වඩාත් ඵලදායී මෙවලම වන්නේ තෝරා ගත් නගරයක පවත්වන විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ඇතුලත් ප්‍රදර්ශන වේ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ගුවන් සේවා සහ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය එකතුවෙන් වාණිජ නිලධාරීන් විසින් ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය සහ චෙන්නායි මුල් කරගත් ප්‍රදර්ශන සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය, වාණිජ නිලධාරීන් සමඟ එක්වී සංචාරක නියෝජිතවරුන්, චාරිකා මෙහෙයවන්නන් 100 ක ට වැඩි පිරිසක් වෙත FAM මාධ්‍ය චාරිකා සංවිධානය කර ඇත.

රූපවාහිනී නාලිකාවල ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්ත පිළිබඳ විස්තරාත්මක වැඩසටහන් විකාශනය කරන ලද අතර විවිධ සඟරාවන් හි ඒ පිළිබඳ ලිපි ද 2017 වසර තුල පල කරන ලදී.

තවද, සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව සංස්කෘතික සැඳෑවන්, ශ්‍රී ලංකීය සමාගම් හි සංචාරය කිරීම සඳහා ව්‍යාපාරික රැස්වීම්, ඉදිරිපත් කිරීම්, ප්‍රවර්ධන මෙවලම් බෙදාහැරීම් යනාදිය වසර පුරාවට පැවති විවිධ වැඩසටහන්වලදී වාණිජ නිලධාරීන් විසින් සංවිධානය කර ඇත.

## 6.5 වෙළඳ, ආයෝජන සහ සංචාරක කටයුතු පිළිබඳ විමසීම් සපුරාලීම

වාණිජ දෙපාර්තමේන්තුව සහ වාණිජ නිලධාරීන් දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන්ගේ වෙළඳාම පිළිබඳ පැනනගින්නා වූ ප්‍රශ්න සඳහා විසඳුම් ලබා දීමේදී විශේෂ සේවාවක් සිදු කරයි. විදේශ පාර්ශවකරුවන්ගේ වෙළඳ විමසීම් මෙන්ම ආයෝජන සහ සංචාරක කටයුතු සම්බන්ධව සිදු කරන විමසීම් සඳහා විදේශ රටවල ස්ථාපිත වාණිජ දූත මණ්ඩල නිලධාරීන් සම්බන්ධ වෙයි. අදාල වසර තුලදී එවැනි ගැටලු ආසන්න වශයෙන් 506ක් වාණිජ නිලධාරීන් වෙත ලැබී ඇති අතර ශ්‍රී ලංකාව ආකර්ෂණීය ආයෝජන හා සංචාරක ගමනාන්තයක් වශයෙන් ද ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශීය වෙළඳපොළෙ හි ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ද ඇතිව වාණිජ නිලධාරීන් විසින් ඒ සඳහා සුදුසු මග පෙන්වීම ලබා දී ඇත.

විදේශීය ගැණුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති එවැනි විමසීම් අදාල ශ්‍රී ලංකික අපනයනකරුවන්ට සෘජුවම මෙන්ම වාණිජ මණ්ඩල, අපනයන සංවර්ධන මණ්ඩලය ආදී ආයතනවල සාමාජිකයන්ගෙන්/ අපනයනකරුවන්ගෙන් ලැබෙන විමසීම්වලට අදාල විදේශීය ගැණුම්කරුවන් සොයා ගැනීම සඳහා ද වාණිජ නිලධාරීන් සිය සහාය ලබා දෙනු ලබයි.

එමෙන්ම ආයෝජන සහ සංචාරක කටයුතු සම්බන්ධයෙන් වාණිජ නිලධාරීන් වෙත් ලැබෙන විමසීම් වලට ඔවුන් විසින්ම සුදුසු පරිදි තොරතුරු සහ සහය ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාවෙහි අදාල ආයතන/ අමාත්‍යංශ වෙත යොමු කිරීම ද සිදු කරයි.

### 6.6 වෙළඳ ආරවුල් විසඳීමට සහය

අපනයන හා ආනයනකරුවන් අතර ඇතිවන වෙළඳ ආරවුල් සුහදශීලී අයුරින් විසඳා ගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් මැදිහත් වනු ලබයි. එලෙස ගනු ලබන පියවර අතිශයින්ම අපක්ෂපාතී සහ සුහදශීලී මෙන්ම අන්‍යෝන්‍යව ගිවිසගත් දෑ නිරවුල් කිරීම අරමුණු කොට සිදු කරනු ලබයි

සමාලෝචනය සිදු කරන කාල සීමව තුල එවැනි වෙළඳ ගැටලු 178 ක් සඳහා වාණිජ නිලධාරීන් මැදිහත්වී ඇත.

### 6.7 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම

විදේශිකයන් විසින් ඔවුන්ගේ ව්‍යාපාරික, වෘත්තීය සහ පෞද්ගලික කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුල වැඩි කාලයක් සිටීමට නේවාසික වීසා අයදුම් කරනු ලබයි. ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා බලපත් ලබාදීම සඳහා අදාල රේඛීය අමාත්‍යාංශයන්ගෙන් නිර්දේශයන් අපේක්ෂා කරයි. ලංකාව වෙත පැමිණීම සහ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතුවල යෙදීමට, විදේශීය සමාගම්වල සහ වෙනත් වෙළඳ සහ වාණිජ ව්‍යාපාරවල සම්බන්ධීකරණ කාර්යාලවල/ ශාඛා කාර්යාලවල සේවයේ නියුතු විගමණිකයන් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත්කිරීම සඳහා නිර්දේශ ලිපි නිකුත්කිරීමේ බලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාණිජ දෙපාර්තමේන්තුව වෙත පවරාදී ඇත.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් වාණිජ ආයතනයන්හි අධ්‍යක්ෂ, උපදේශක සහ විශේෂිත කාණ්ඩ යටතේ සිටින සුදුසුකම් ලත් විදේශිකයන්, ඔවුන්ගේ යැපෙන්නන් වෙත ඔවුන්ගේ ඉල්ලීමට අදාලව ඇතුල්වීමට සහ දීර්ඝ කිරීමට අදාල නේවාසික වීසා නිර්දේශ ලිපි අවුරුද්දක කාලයක් සඳහා නිකුත් කරයි. එවැනි සේවා නියුක්තියක් මගින් අපනයන වෙළඳාම, තාක්ෂණික මාරුව සහ ඵලදායිතා වර්ධනය සඳහා ඇතිවන සෘජු ප්‍රතිලාභ සහ එමඟින් ජාතික ආර්ථිකයට ඇතිවිය හැකි වාසි සැළකිල්ලට ගනිමින්, එවැනි වීසා බලපත්‍ර නිර්දේශ සඳහා ඉදිරිපත්වන අයදුම්පත් දැඩි ලෙස තක්සේරු කරනු ලැබේ.

2016 වසරේදී වාණිජ දෙපාර්තමේන්තුව විසින් සමාගම් 80 ක ජාතීන් 27 ක යැපෙන්නන් 114 සැදුම්ලත් අයදුම්කරුවන් 146 ක් සඳහා නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දෙන ලදී. 2016 වර්ෂයට සාපේක්ෂව එය සමාගම් 8, ජාතීන් 2, යැපෙන්නන් 28 ඇතුළු අයදුම්කරුවන් 25 ක ඉහළ යාමකි.

### 6.8 ණයදෙන ආයතන අනුමත කිරීම

1949 අංක 06 දරන උකස් පනත යටතේ, ඕනෑම සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ සිය අනුමැතිය දෙනු ලබන්නේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114 (1) වන වගන්තිය යටතේ ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මත පදනම්ව වේ.

සමාලෝචිත වර්ෂයේ දී වාණිජ දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් 2 ක් සකසන ලදී .මෙම අයදුම්පත් 2 න් , සමාගම් කිසිවක් අනුමත ණයදෙන ආයතන ලෙස ගැසට් නිවේදනය කර නොමැත.

### 6.9. ශ්‍රී ලංකාව විශේෂිත ප්‍රවර්ධන වැඩසටහන්

විදේශීය ගැණුම්කරුවන් ආකර්ෂණය කරගැනීමේ සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ලොව පුරා ප්‍රචලිත කිරීමේ පරමාර්ථයෙන්, විදේශ රටවල ස්ථාපිථ වාණිජ නිලධාරීන් විසින් ඔවුන්ට අදාල රටවල් තුල ශ්‍රී ලංකාව විශේෂිත විවිධාකාර වැඩසටහන් සංවිධානය කරයි. 2017 වසර තුල ඔවුන් විසින් වැඩසටහන් 102 ක් සංවිධානය කරන ලදී.

### 6.10. වෙළඳාම හා බැදි යුරෝපා සංගමය අනුගෘහිත ශක්‍යතා සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ පොදු අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳ-මූලික වර්ධනය හා කලාපීය ඒකාබද්ධතාවය සඳහ දායක වීමෙන් දුගීබව තුරන් කිරීමට දායක වීමයි.

"යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වෙළඳාම සම්බන්ධ සහය: කලාපීය හා යුරෝපා සංගමයේ වෙළඳපොළ තුල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ තරගකාරීත්වය වර්ධනය කිරීම" යන ව්‍යාපෘතිය , 2013 දෙසැම්බර් මස 2 වන දින බ්‍රසල්ස් හි පැවති යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ කමිටුව හා සමගාමීව පැවත් වූ වෙළඳ හා ආර්ථික සම්බන්ධතා පිළිබඳ යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වැඩ කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී.

යුරෝපා සංගමය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 8 ක අරමුදල් ලබා දීමට එකඟ වූ අතර ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ක්‍රියා කරනවිට වාණිජ දෙපාර්තමේන්තුව එහි ජාතික සම්බන්ධීකාරක ලෙස පත් කර ඇත.

පහත ප්‍රධාන ක්ෂේත්‍ර හතර ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් දියත් කර ඇත.

1) ER 1. අපනයන තරඟකාරීත්වය සඳහා ගැලපෙන ප්‍රතිපත්ති, නියාමන ප්‍රතිසංස්කරණ සහ ලෝක වෙළඳ සංවිධානය විසින් සකස්කරන ලද වෙළඳ ගිවිසුම්, කලාපීය ඒකාබද්ධතා ක්‍රියාවලිය සහ යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (GSP+) ඇතුලත් කරමින් සකස් කර ක්‍රියාත්මක කෙරෙන උපක්‍රම.

2) ER 2. දේශසීමා ක්‍රියාවලි සහ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය හා යුරෝපා සංවිධානයේ වෙළඳපොළ වෙත අපනයනය කිරීමට අනුකූල වීම සඳහා සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන් හි ශක්‍යතාවය වැඩිදියුණු කිරීම.

3) ER 3. කලාපීය සහ යුරෝපා වෙළඳපොළේ අවශ්‍යතාවයන්ට සරිලන ගුණාත්මකබව මෙන්ම සෞඛ්‍ය සහ ස්වස්ථතා මට්ටම්වලට ගැලපෙන පරිදි අනුකූලතාවයන් සහ ගුණාත්මක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

4) ER 4. අපනයන දිශාන්ත ක්ෂේත්‍රයන් කෙරෙහි සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරයන්ගේ තරඟකාරීත්වය ඉහළ නැංවීම. (කුළුබඩු, අහාර සහ IT/BPO කර්මාන්ත )

2017 වසර තුල වාණිජ දෙපාර්තමේන්තුව විසින් පහත කටයුතු සිදු කරන ලදී.

- සම්මන්ත්‍රණ ශාලාවේ වීඩියෝ සම්මන්ත්‍රණ පද්ධතියක් සවි කිරීම.
- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර සඳහා මගපෙන්වීම් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන්ම ඉදිරිපත් කිරීමට දායක වීම.
- වෙළඳාම පහසුකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳාම පහසුකරණ කමිටුවෙහි තාක්ෂණික කමිටුවේ සාමාජිකයින් සඳහා 2017 අප්‍රේල් 19-20, 24-25 දිනයන් හි කොළඹ පුහුණු වැඩමුළු දෙකක් පැවැත්වීම.
- නිදහස් වෙළඳ ගිවිසුම් උපරිමයෙන් භාවිතා කිරීම (FTA) - නිදහස් වෙළඳ ගිවිසුම් හි බලපෑම ඇගයීම සඳහා ප්‍රමාණාත්මක වෙළඳ ආකෘති හැඳින්වීම - 2017 මැයි 24-25 කොළඹ
- නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා වැඩමුළුව - 2017 අගෝස්තු 1-3 කොළඹ දී.
- වෙළඳ සාකච්ඡා ආභාසන වැඩමුළුව 2017 ජූලි 24-27
- යුරෝපා බාහිර ක්‍රියාමාර්ග සහ ජීඑස්පී ප්ලස් - අනුකූලතාවය සහ භාවිතය - 2017 නොවැම්බර් මස 6-9, බ්‍රසල්ස් හි දී පවත්වන ලදී.
- වෙළඳාම සහ වෙළඳ ගිවිසුම් (මොඩියුල පුහුණුව ) පිළිබඳ තාක්ෂණික ශක්‍යතා ගොඩනැගීම - 2017 අගෝස්තු 23-24 කොළඹ දී පවත්වන ලදී.
- පුහුණු මොඩියුල I කොටස - 'වෙළඳ සන්ධානගත වීම සහ ආර්ථික විද්‍යාව හැඳින්වීම' (අගෝස්තු 23-24 කොළඹ )
- මූලික හා අනුක්‍රමික වශයෙන් වෙළඳාම පහසුකරණ සංශෝධන ක්‍රියාත්මක කිරීම - 2017 ඔක්තෝබර් 11-12 කොළඹ දී පවත්වන ලදී.
- වෙළඳ පිරියම් හඳුන්වාදීමේ පුහුණු පාඨමාලාව - 2017 ඔක්තෝබර් 25-27 කොළඹ දී පවත්වන ලදී.
- EUROSTAT පැවති ජාත්‍යන්තර අධ්‍යන සංචාරය නොවැම්බර් 6-10, ලක්සම්බර්ග්.
- නිදහස් වෙළඳ ගිවිසුම්හි මනා භාවිතය සහ වත්මන් ප්‍රවණතාවයන් කලාපීය වැඩමුළු 2017 නොවැම්බර් 6 යාපනය, 10 මහනුවර පැවැති විය.

## 7. ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම

පහත සඳහන් වරණීය ගිවිසුම් සහ කලාපීය, ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික සම්භවීය නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කරනු ලබයි.

- වරණීය පොදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු-ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ආසියානු-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

සාමාන්‍ය වැඩකරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 500 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදුව නිකුත් කරනු ලැබ ඇත. පූර්ව දැනුම්දීමකින් තොරව රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක හමුවිය හැකි පූර්ණකාලීනව ප්‍රභවස්ථාන සහතික අංශය වෙත අනුයුක්තව කටයුතුකරන, ඉතා ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් උපදෙස් ලබා දීම සඳහාත්, වැඩිදුර තොරතුරු පැහැදිලිකර දීම සඳහාත් සූදානම්ව සිටියි. සාමාන්‍යයෙන්, පත්කර ඇති නිලධාරීන් විසින් අපනයනකරුවන් 30 - 50 දෙනෙකුට දිනපතා උපදෙස් ලබා දෙනු ලැබේ. ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම, විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අදාළ ප්‍රභවස්ථාන රීති නිර්ණායකය පිළිබඳව ගැඹුරු දැනුමක් ලබාගැනීම යනු අවශ්‍යවන ඉතා විශේෂිත කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම් වන්නේ;

(අ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීම,
(ආ) අපනයනකරුවන්ගේ තොරතුරු සටහන් (profiles) ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම,
(ඇ) පිරිවැය ප්‍රකාශයන් සහ යෝග්‍යතාව සපුරාලීම සඳහා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ආධාරක ලිපිලේඛන ඇගයුමට ලක්කිරීම,
(ඈ) වරණය ලබාදෙන්නා වූ රටවල ඉල්ලීම මත ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ
(ඉ) ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම.

පසුගිය වසර 3 තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් වල විස්තර පහත දැක්වේ.

| ගිවිසුම් | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|
| | නිකුත් කරන ලද ප්‍ර.ස. ගණන | සමස්ත අපනයන වටිනාකම ඇ.ඩො.මි | නිකුත් කරන ලද ප්‍ර.ස. ගණන | සමස්ත අපනයන වටිනාකම ඇ.ඩො.මි | නිකුත් කරන ලද ප්‍ර.ස. ගණන | සමස්ත අපනයන වටිනාකම ඇ.ඩො.මි |
| EU GSP | 72,675 | 2122.03 | 74,003 | 2,243.51 | 80,867 | 2473.91 |
| GSP Other Countries | 12,465 | 991.32 | 12,495 | 1,150.22 | 12,468 | 1429.47 |
| ISFTA | 11,494 | 407.2 | 12,621 | 375.16 | 12,864 | 442.29 |
| PSFTA | 7,320 | 58.84 | 6,673 | 51.52 | 6,703 | 60.33 |
| APTA | 4,025 | 118.7 | 4,508 | 125.60 | 6,038 | 150.8 |
| SAFTA | 231 | 15.39 | 149 | 6.89 | 679 | 41.07 |
| SAPTA | 304 | 5.26 | 288 | 3.40 | 277 | 4.49 |
| GSTP | 150 | 49.14 | 143 | 45.14 | 100 | 81.2 |
| එකතුව | **108,664** | **3,767.88** | **110,830** | **4,001.44** | **120,277** | **4,683.56** |

මූලාශ්‍ර : වාණිජ දෙපාර්තමේන්තුව/ ශ්‍රී ලංකා රේගුව

## 8. වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංචලන – 2017

| නිලධාරියාගේ නම | සංචලනය | දිනය |
|---|---|---|
| *සේවා ස්ථාන මාරුවීම් - දෙපාර්තමේන්තුවට ආපසු පැමිණීම්* | | |
| ඩී.එම්.එන්.පී. විජේරත්න මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ස්විස්ටර්ලන්තයේ ජිනීවා හි ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය මෙහෙයුමේ සිට සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 02.01.2017 |
| ඩී.ඩී. ප්‍රේමරත්න මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ජපානයේ ටෝකියෝවේ හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 03.04.2017 |
| ඩී.එම් රත්නායක මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ සිට පැමිණීම | 15.05.2017 |
| එච්.කේ.ඩබ්. ලියනගේ මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | තායිලන්තයේ බැංකොක් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 08.06.2017 |
| සී.එම්.ජී.ආර්. සිල්වා මිය<br>වාණිජ අධ්‍යක්ෂ | බෙල්ජියමේ බ්‍රසල්ස් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 01.07.2017 |
| ඩබ්.පී.ඒ.එෆ් ගුණසේකර මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ප්‍රංශයේ පැරිස් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 10.07.2017 |
| ඒ.ජී.එන්. කරුණාතිලක මයා<br>වාණිජ අධ්‍යක්ෂ | එක්සත් රාජධානියේ ලන්ඩන් හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 31.07.2017 |
| එච්.එම්.බී. හේරත් මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | පකිස්ථානයේ කරච්චි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 02.08.2017 |
| එම්.එම්.ටී.ඩී. මුල්ලෙගම්ගොඩ මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ස්වීඩනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 08.08.2017 |
| පී.කේ.එස්. පට්ටිවල මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | මැලේසියාවේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 16.08.2017 |
| ආර්. මල්ලිකාරච්චි මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | සිංගප්පූරුවෙ හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 22.08.2017 |
| සී.කේ. කිරිවන්දල මෙය<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | රුසියාවේ මොස්කව් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණීම | 17.10.2017 |
| *සේවා ස්ථාන මාරුවීම් - විදේශ දූත මණ්ඩල සඳහා පත්කිරීම්* | | |
| ආර්.ජී.එස්.පී.කේ විජේසේකර මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ජපානයේ ටෝකියෝ හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පත් කිරීම | 20.04.2017 |
| අබ්දුල් රහීම් මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට පත් කිරීම | 11.05.2017 |
| ඩබ්.ඒ.පී සිරිමාන්න මයා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | තායිලන්තයේ බැංකොක් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පත් කිරීම | 01.06.2017 |
| එල්.ජී. දිසානායක මයා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | කැනඩාවේ ටොරොන්ටෝ හි පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට පත් කිරීම | 26.06.2017 |
| පී.ඒ.එස්. පොන්නම්පෙරුම මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පත් කිරීම | 01.07.2017 |
| ඊ.ටී.එම්.සී.එස්. අබේරත්න මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ප්‍රංශයේ පැරිස් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පත් කිරීම | 03.07.2017 |

| | | |
|---|---|---|
| යූ. සමරතුංග මෙය<br>වාණිජ අධ්‍යක්ෂ | ඉන්දියාවේ නව දිල්ලියෙ හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට පත් කිරීම | 15.07.2017 |
| ඩබ්.ජී.වයි.එන් ගුණවර්ධන මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ස්වීඩනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පත් කිරීම | 28.07.2017 |
| ඩබ්.එම්.බී. අබේකෝන් මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | මැලේසියාවේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට පත් කිරීම | 03.08.2017 |
| කේ.ඩී.එන්. කොඩිකාර මිය සහකාර<br>වාණිජ අධ්‍යක්ෂ | සිංගප්පූරුවෙහි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට පත් කිරීම | 16.08.2017 |
| එස්.එච්.එස්.ආරියරත්න මිය<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | බෙල්ජියමේ බ්‍රසල්ස් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පත් කිරීම | 01.10.2017 |
| ජී.එල්. ඥානදේව මයා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | පකිස්ථානයේ කරච්චි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට පත් කිරීම | 07.11.2017 |
| ඩබ්.සී.කේ. පෙරේරා මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | රුසියාවේ මොස්කව් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට පත් කිරීම | 08.12.2017 |
| බඳවාගැනීම් | | |
| ඩබ්.ඒ.එස්.කේ. පෙරේරා මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 01.06.2017 |
| කේ.කේ.එස්. සමීර මයා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 01.06.2017 |
| ටී.සී. විතානවසම් මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 01.06.2017 |
| පී.කේ. බූමාවලගේ මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 01.06.2017 |
| ජේ.ඒ.සී.ඒ. ජයවර්ධන මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 01.06.2017 |
| එම්.ඩබ්.එම්. අබේකෝන් මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 01.06.2017 |
| එස්.එම්.එස්.ආර්. බණ්ඩාර මයා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 01.06.2017 |
| ජී.කේ. සේනාරත්න මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 28.12.2017 |
| ඩබ්.ටී.එස්. පෙරේරා මෙය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 28.12.2017 |
| ජේ.ඩී. හෙට්ටිආරච්චි මයා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගන්නා ලදී | 28.12.2017 |
| විශ්‍රාම ගැනීම් | | |
| - | - | - |

## 9. වාර්ෂික ගිණුම් - 2017

**ශීර්ෂ අංකය: 295**

**අමාත්‍යංශය / දෙපාර්තමේන්තුව :- වාණිජ දෙපාර්තමේන්තුව**

**වැඩසටහන් අංකය: 01**

**ව්‍යාපෘති අංකය: 01**

**පුනරාවර්තන වියදම්**

| විස්තරය | 2016 සත්‍ය වියදම Rs. 000 | 2017 අනුමත ඇස්තමේන්තුව Rs. 000 | 2017 සංශෝධිත ඇස්තමේන්තුව Rs. 000 | 2017 සත්‍ය වියදම Rs. 000 | 2017 ඉතිරිය Rs. 000 |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 46,969 | 48,100 | 52,750 | 51,357 | 1,393 |
| වෙනත් | 62,156 | 70,967 | 69,550 | 64,408 | 5,142 |
| **මුළු වියදම** | **109,125** | **119,067** | **122,300** | **115,765** | **6,535** |

| මූලධන වියදම් | | | | | |
|---|---|---|---|---|---|
| වැය විෂය අංකය / විස්තර | 2016 සත්‍ය වියදම රු.'000 | 2017 අනුමත ඇස්තමේන්තු රු.'000 | 2017 සංශෝධිත ඇස්තමේන්තු රු.'000 | 2017 සත්‍ය වියදම රු.'000 | 2017 ඉතිරිය රු.'000 |
| **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම** | 537 | 2,450 | 2,710 | 2,119 | 591 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් (2001) | 212 | 2,000 | 2,260 | 2,108 | 152 |
| වාහන (2003) | 325 | 450 | 450 | 11 | 439 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | 2,279 | 2,000 | 3,157 | 3,148 | 9 |
| ලී බඩු හා කාර්යාලයීය උපකරණ (2102) | 1,512 | 1,000 | 1,000 | 991 | 9 |
| යන්ත්‍රෝපකරණ (2103) | 767 | 1,000 | 2,157 | 2,157 | - |
| **මානව සම්පත් සංවර්ධනය** | 2,454 | 2,500 | 2,500 | 2,077 | 423 |
| කාර්ය මණ්ඩල පුහුණු (2401) | 2,454 | 2,500 | 2,500 | 2,077 | 423 |
| **වෙනත් මූලධන වියදම්** | 4,847 | 6,000 | 6,000 | 5,828 | 172 |
| ආයෝජන (2502) | 4,847 | - | - | - | - |
| සංවර්ධන සහය (2202) | - | 6,000 | 6,000 | 5,828 | 172 |
| **එකතුව** | **10,117** | **12,950** | **14,367** | **13,172** | **1,195** |